# සිව්වැනි කොටස

## මහ බැංකුවේ හා ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයවුම්වලට අදාළ

## 1987 ප්‍රධාන නීති අනපනත්


| | | පිටුව |
|---|---|---|
| 1. | 1987 අංක 8 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත ... ... | I |
| 2. | 1987 අංක 9 දරණ පිරිවැටුම් බදු (සංශෝධන) පනත ... ... | XVII |
| 3. | 1987 අංක 33 දරණ ජාතික ඉතිරි කිරීමේ බැංකු (සංශෝධන) පනත ... | XXII |
| 4. | 1987 අංක 36 දරණ සුරැකුම් පත් සභා පනත ... ... | XXII |
| 5. | 1987 අංක 51 දරණ විසර්ජන පනත ... ... | XLVI |

# 1987 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 මාර්තු මස 6 වන දින]

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1987 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ 4 වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි ''යම් දේපළක අයිතියෙහි වෙනස් වීමක් සිදු වූ විට—'' යන වචන වෙනුවට ''1986 නොවැම්බර් මස 12 වන දිනට පෙරාතුව යම් දේපළක අයිතියෙහි වෙනස් වීමක් සිදු වූ විට'' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(5) 1986 නොවැම්බර් මස 12 වන දින හෝ ඉන් පසු යම් තැනැත්තකුට උද්ගතවන යම් ප්‍රාග්ධන ලාභයක් සම්බන්ධයෙන් ''1957 අප්‍රේල් මස 1 වන දින'' සම්බන්ධයෙන් (3) වන උපවගන්තියෙහි හෝ (4) වන උප වගන්තියෙහි ඇති සෑම සඳහනක්ම, ''1977 අප්‍රේල් මස 1 වන දින'' සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතුය.''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ ඡේදයේ (XLIX) අනුඡේදයේ ''1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල පනතින් පිහිටුවන ලද ජනාධිපති අරමුදල'' යන ඉලක්කම් සහ වචන වෙනුවට ''1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල පනතින් පිහිටුවන ලද ජනාධිපති අරමුදල ; සහ'' ; යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ ඡේදයේ අන්තිමට පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

''(L) 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතින් පිහිටුවන ලද ජාතික ආරක්ෂක අරමුදල.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඕ) ඡේදයේ (i) වන අනුඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ අනුඡේදයේ (ආ) විෂයයෙහි ''යම් තක්සේරු වර්ෂයක දී'' යන වචන වෙනුවට ''තක්සේරු වර්ෂයේ දී'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ අනුඡේදය අන්තිමට පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

''(ඇ) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී රුපියල් හතලිස් පන් දහසක්.''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (ඉ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ඉ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතය ඇතිව යම් තැනැත්තකු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් වාණිජ බැංකුවක විවෘත කරන ලද යම් ගිණුමක විදේශ ව්‍යවහාර මුදලින් ඔහුගේ බැරට ඇති මුදල් මත ඒ තැනැත්තාට උපචය වන පොලිය.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (i) වන සහ (ii) වන අනුඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :—

" (i) යම් පුද්ගලයකු විසින් ඉදි කරනු ලැබ, හුදෙක්ම වාසික කාර්ය සඳහා පාවිච්චි කරනු ලැබුවා වූ නිවාසයක් වන්නා වූ ද, ඒ නිවාසයේ යම් විකිණීම පළමු විකිණීම වන්නා වූ ද ඒ නිවාසය ඒ පුද්ගලයා විසින් විකිණීමෙන් හෝ රජය විසින් අත් කර ගැනීමෙන් ;

(ii) (i) වන අනුඡේදයෙහි සඳහන් නිවාසයක් නොවන යම් නිවාසයක් 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු යම් පුද්ගලයකු විසින් විකුණා නොමැති නම්, හෝ රජය විසින් ඒ පුද්ගලයාගෙන් අත් කරගෙන නොමැති නම්, ඒ පුද්ගලයාට අයත් වූ ද හුදෙක්ම වාසික කාර්ය සඳහා පාවිච්චි කරනු ලැබුවා වූ ද යම් නිවාසයක් ඒ පුද්ගලයා විසින් විකිණීමෙන් හෝ රජය විසින් අත් කර ගැනීමෙන් ;".

(2) එහි (iv) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:—

"(iv) (අ) මේ පනතේ 23 වන වගන්තිය යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 10 වන වගන්තිය යටතේ හෝ ආදායම් බදු ආඥා පනතේ 11 වන වගන්තිය යටතේ හෝ ක්ෂයවීම සඳහා දීමනාවක් සඳහා ඉඩ දී ඇත්තා වූ ඔහු විසින් පවත්වා ගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක, රක්ෂාවක හෝ සේවා නියුක්තියක ආදායම උපදවීම සඳහා ඔහු විසින් 1987 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යම් දේපළක් විකිණීමෙන් ;

(ආ) තමා විසින් පවත්වා ගෙන යනු ලැබූ හෝ ක්‍රියාත්මක කරනු ලැබූ යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින්, රක්ෂාවකින් හෝ සේවා නියුක්තියකින් ආදායම උපදවීම සඳහා යම් තැනැත්තකු විසින් ප්‍රයෝජනයට ගනු ලැබුවා වූ ද යම් දේපළක් ප්‍රතියෝජනය කිරීම සඳහා විකිණීමේ දින සිට එක් අවුරුද්දක් ඇතුළත විකිණීමෙන් ලත් සම්පූර්ණ මුදල ප්‍රයෝජනයට ගනු ලබන්නේ නම් ක්ෂයවීම සඳහා 23 වන වගන්තිය යටතේ ඔහු විසින් දීමනාවක් ප්‍රදානය කොට ඇත්නම්, ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය, රක්ෂාව හෝ සේවා නියුක්තිය පවත්වාගෙන යාමේ දී ඔහු විසින් ආදායම උපදවීමෙහිලා පාවිච්චි කරනු ලැබූ දේපළ වන 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ඒ තැනැත්තා විසින් අත්කර ගන්නා ලද යම් දේපළක් විකිණීමෙන් ;".

(3) එහි (xiii) අනුඡේදයෙහි 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසු සංක්‍රාන්ති වීමෙන් ; යන ඉලක්කම් සහ වචන වෙනුවට ''1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව එහෙත් 1986 නොවැම්බර් මස 12 වන දිනට පෙරාතුව සංක්‍රාන්ති වීමෙන්'' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

(4) එහි (xiv) වන අනුඡේදයෙහි ''ඒ සමාගමට පැවරීමෙන් පැන නැගෙන යම් ප්‍රාග්ධන ලාභයක්'' යන වචන වෙනුවට ''ඒ සමාගමට පැවරීමෙන් ;'' යන වචන ආදේශ කිරීමෙන්.

(5) එහි (xiv) වන අනු ඡේදයෙහි අන්තිමට පහත දැක්වෙන අනු ඡේද එකතු කිරීමෙන් ;

''(xv) (අ) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ; සහ

(ආ) පුද්ගලයකු විසින් තනිවම හෝ වෙනත් අය සමග හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ පවත්වාගෙන යන ලද ව්‍යාපාරයක් (xiv) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක් නොවන සීමාසහිත වගකීම් ඇති සමාගමකට පරිවර්තනය කිරීම මත

ඒ ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කම් ඒ සමාගමට පවරනු ලැබුවේ නම්, එහෙත්—

(ඇ) ඒ ව්‍යාපාරය තනි අයිතිය ඇති ව්‍යාපාරයක් වූ යම් අවස්ථාවක, එහි කලින් අයිතිකරු විසින් ; හෝ

(ඈ) ඒ ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් වූ යම් අවස්ථාවක, හවුල් ව්‍යාපාරයේ ලාභ බෙදා ගනු ලැබුවේ යම් අනුපාතයක් අනුව ද ඒ අනුපාතය අනුව එහි කලින් හවුල්කරුවන් විසින් හෝ ඒ සීමාසහිත වගකීම ඇති සමාගමේ කොටස්වලින් සියයට අසූවකට නොඅඩු කොටස් ප්‍රමාණයක් දරනු ලැබුවේ නම් පමණක් පැවරීමෙන් ;

(xvi) යම් තැනැත්තකු විසින් යම් දේපළක් අත් කර ගැනීමෙන් අවුරුදු විසිපහකට නොඅඩු කාලයකට පසු ඒ තැනැත්තා විසින් 1986 නොවැම්බර් මස 12 වන දින හෝ ඉන් පසු ඒ දේපළ විකිණීමෙන් පැන නැගෙන යම් ප්‍රාග්ධන ලාභයක් ;''

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ඇඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:—

(ඇඇඇ) ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් හෝ විසින් යම් වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වාගෙන යාමේදී හෝ කරගෙන යාමේදී ඒ පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ඉටු කරන ලද සේවා සම්බන්ධයෙන් යම් තක්සේරු වර්ෂයක දී විදේශීය ව්‍යවහාර මුදල්වලින් උපයනු ලැබුවා වූ ද එහෙත් එකී ශ්‍රී ලංකාවෙන් පිටත වූ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය යටතේ සේවා නියුක්තියකින් උපයනු නොලැබුවා වූ ද පඩිනඩි සහ ගාස්තු ඔහු විසින් බැංකුවක් මගින් ඔහුට හෝ ඒ හවුල් ව්‍යාපාරයට ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබුවහොත් එවැනි පඩි නඩි සහ ගාස්තු ;''.

(2) ඒ වගන්තියේ (ඕ) සහ (ග) ඡේද ඉවත් කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (ත) ඡේදයේ ''අරමුදලින් තැනැත්තකුට ලැබුණු යම් මුදලක්'' යන වචන වෙනුවට ''අරමුදලින් තැනැත්තකුට ලැබුණු යම් මුදලක් ;'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ අන්තිමට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

''(ද) 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල පනතින් පිහිටුවන ලද ජාතික ආරක්ෂක අරමුදලින් තැනැත්තකු විසින් ලද යම් මුදලක්.''.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ '' ඒ සමාගම විසින් එහි ප්‍රථම අපනයනයන්'' යන වචන සිට ''අවුරුදු පහක කාලයක් සඳහා ද,'' යන වචන දක්වා වූ වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''ඒ සමාගම විසින් ලාභ උපදවීම ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ දී එහි ගණුදෙනු සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ සිට ගණන් ගනු ලබන අවුරුදු පහක කාලයක් සඳහා ද,''.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

20ආ. යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක ලාභ සහ ආදායම 20 වන වගන්තියේ (1) වන වගන්තිය යටතේ හෝ 20අ වන වගන්තිය යටතේ හෝ ආදායම් බද්දෙන් නිදහස් වේ ද ඒ තැනැත්තා විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් භාණ්ඩ නිෂ්පාදනය කර හෝ සාද යම් අපනයන කරුවකුට සැපයීමෙන් ලබන ආදායමෙන් සහ ලාභයෙන් සමන්විත වන්නා වූ ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ ලාභයෙන් හෝ ආදායමෙන් (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායම් කොටස, ඒ භාණ්ඩ සැපයීමට අදාළ අපනයනවල විදේශ විනිමය වටිනාකම ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම සඳහා ජාත්‍යන්තර ණයවර ලිපියක සහතිකය පිට බැංකුවක ඇපය මත යන පදනම මත ශ්‍රී ලංකාවේ බැංකුවක විවෘත කරන ලද ණයවර ලිපියකින් ආවරණය වන්නේ නම්, ආදායම් බද්දෙන් නිදහස් වන්නේය.''.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) (ඉ) ඡේදයෙහි ''අත්කර ගනු ලැබ, ඔහු විසින් කරගෙන යනු ලබන්නා වූ'' යන වචන වෙනුවට ''අත්කර ගනු ලැබ, 1987 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ඔහු විසින් කරගෙන යනු ලබන්නා වූ'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ඉඉ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඉඉඉ) (i) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් අත්කර ගනු ලැබූ (ii) වන අනු ඡේදයෙහි සඳහන් පිරියතක්, යන්ත්‍ර හෝ සවි කිරීම් නොවන) යම් පිරියතක්, යන්ත්‍ර හෝ සවිකිරීම් සහ ඔහු විසින් කර ගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ඒවා පාවිච්චි කිරීමේ දී ගෙවී යාමෙන් උද්ගතවන ක්ෂය වීම සඳහා ඒවා අත්කර ගැනීමේ පිරිවැය මත වර්ෂයකට සියයට 33⅓ ක අනුප්‍රමාණය අනුව ;

(ii) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් ගන්නා ලද යම් මෝටර් වාහනයක්, ලොරියක්, බස් රථයක්, ට්‍රැක්ටරයක් ට්‍රේලරයක් හෝ කාර්යාල ගෘහ භාණ්ඩ ඔහු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ඒවා පාවිච්චි කිරීමේ දී ගෙවීයාමෙන් උද්ගතවන ක්ෂයවීම සඳහා එය අත්කර ගැනීමේ පිරිවැය මත වර්ෂයකට සියයට 25 ක අනුප්‍රමාණ අනුව ;

(iii) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ඉදිකිරීම සම්පූර්ණ කරන ලැබුවා වූ යම් සුදුසුකම්ලත් ගොඩනැගිල්ලක් සහ යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක එය ප්‍රයෝජනයට ගැනීමේ දී ගෙවීයාමෙන් උද්ගතවන ක්ෂයවීම සඳහා එය ඉදිකිරීමේ පිරිවැය මත වර්ෂයකට සියයට 10 ක අනුප්‍රමාණ අනුව දීමනාවක් " ;

(ඇ) (ඩ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ණ) යම් වාණිජ ස්ථානයක් ඒ තැනැත්තාට කුලියට දීම හෝ බදු දීම සම්බන්ධයෙන්, ඒ තැනැත්තා විසින් 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු වෙනත් යම් තැනැත්තකුට එකවර ගෙවන ලද යම් මුදලක් සම්බන්ධයෙන් වන විට, වර්ෂයේ බදු කුලිය ගෙවිය යුතු මාස ගණන හා බද්ද සංයුක්ත වන මුළු මාස ගණන අතර අනුපාතය, යට කී එකවර ගෙවන ලද මුදලේ යම් කොටසක් එකී එකවර ගෙවන ලද මුදලට සමානුපාතික වේ ද ඒ කොටස ;

(ත) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ රජය සතු කරන ලද වෙළෙඳ ව්‍යාපාරයක් විසින් හෝ විශේෂ අයකිරීමක් වශයෙන් ආණ්ඩුවට ගෙවන ලද යම් මුදලක්.".

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි—

(අ) (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ලාභ සහ ආදායම උපදවීමේ දී ඔහු විසින් පාවිච්චි කරනු ලබන

යම් ප්‍රාග්ධන වත්කමක් ඒ තැනැත්තා විසින් බැහැර කිරීම සම්බන්ධයෙන් 1987 අප්‍රේල් මස 1 වන දිනට පසු මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් අදාළ නොවිය යුතු ය ;

(ආආආ) (i) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ලාභ සහ ආදායම උපදවීමේ දී ඔහු විසින් පාවිච්චි කරනු ලැබූ යම් ප්‍රාග්ධන වත්කමක් ඔහු විසින් 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු බැහැර කරනු ලබන සහ ඒ ප්‍රාග්ධන වත්කම සම්බන්ධයෙන් (1) වන වගන්තිය යටතේ ක්ෂයවීම සඳහා ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ පිරිවැයට සමානවන දීමනාවක් ප්‍රදානය කොට ඇති අවස්ථාවක, ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව නොකඩවා පවත්නා අතරතුර නැතහොත්, ඉන්පසුව හෝ එය අවසන් කිරීමෙන් පසුව ඒ බැහැර කිරීම සිදුවුවද, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ඒ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී ඒ ප්‍රාග්ධන වත්කම් සම්බන්ධයෙන් ඒ අත්කර ගැනීමේ පිරිවැය නොඉක්මවන්නා වූ බැහැර කිරීමෙන් ලත් මුදලෙන් කොටසක් ඒ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ලැබීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(ii) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ලාභ සහ ආදායම් උපදවීමේ දී ඔහු විසින් පාවිච්චි කරනු ලැබූ යම් ප්‍රාග්ධන වත්කමක්, ඒ තැනැත්තා විසින්, 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව බැහැර කරනු ලබන්නා වූ සහ ඒ ප්‍රාග්ධන වත්කම් සම්බන්ධයෙන් ක්ෂයවීම සඳහා දීමනාවක්, ප්‍රදානය කොට ඇත්තා වූ ද, එහෙත් ඒ දීමනාවේ සම්පූර්ණ මුදල් ප්‍රමාණය ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ පිරිවැයට අඩුවන්නා වූ ද අවස්ථාවක, ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ පිරිවැය නොඉක්මවමින් එකී බැහැර කිරීමෙන් උපලබ්ධවන මුදල, පහත සඳහන් පරිදි, එනම් ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ පිරිවැය සහ ඒ ප්‍රාග්ධන වත්කම සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද අගය ක්ෂයවීම සඳහා වූ සම්පූර්ණ දීමනාව ද අතර ඇති වෙනසට වඩා වැඩි වේ නම් එසේ වැඩිවන ප්‍රමාණය, ඒ බැහැර කිරීම සිදුවූයේ ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව පවත්වාගෙන යමින් තිබිය දී වුව ද එය නතර කිරීමෙන් පසුව වුව ද 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ඒ වෙළෙඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් ලැබෙන ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී ඒ වෙළෙඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් උද්ගත වූ ලැබීමක් ලෙස, සලකනු ලැබිය යුතු ය :

එසේ වුවද, මේ ඡේදයේ කිසිවක්—

(අ) පුද්ගලයකු විසින් තනිවම හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් කරගෙන යනු ලබන ව්‍යාපාරයක් සමාගමකට පරිවර්තනය කිරීම මත 14 (xv) වගන්තියෙහි සඳහන් ඒ සමාගමට ඒ ප්‍රාග්ධන වත්කම් කිසිවක් 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු පැවරීමට ; හෝ

(ආ) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක, රක්ෂා-වක හෝ සේවානියුක්තියක ආදායම උපදවීම සඳහා, ඔහු විසින් පාවිච්චි කරනු ලබන ප්‍රාග්ධන කිසිවක් අත් කර ගැනීම සඳහා, ප්‍රාග්ධන වත්කම් බැහැර කිරීමෙන් ලත් මුදල් ඒ තැනැත්තා විසින් බැහැර කිරීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත ප්‍රයෝජනයට ගනු ලබන්නේ නම්, ඒ තැනැත්තා විසින් එවැනි යම් ප්‍රාග්ධන වත්කම් කිසිවක් බැහැර කිරීමට අදාළ නොවිය යුතු ය.''.

(ආ) (ඇ) ඡේදයේ සහ (ඈ) ඡේදයේ ''(අ) ඡේදය සහ (ආ) ඡේදය යටතේ'' යන වචන යෙදෙන කවර විටක වුව ද ඒ වචන වෙනුවට ''(අ) ඡේදය, (ආ) ඡේදය හෝ (ආආආ) ඡේදය යටතේ යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (7) උපවගන්තියෙහි (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

''(ඊ) මේ වගන්තියේ කාර්ය සඳහා—

(i) (1) වන උපවගන්තිය යටතේ දීමනාවක් ප්‍රදානය කොට ඇත්තා වූ ද යම් ප්‍රාග්ධන වත්කමක් යම් තැනැත්තකු විසින් 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු විකුණනු ලබන්නා වූ ද විකිණීමෙන් ලත් මුදල් විකිණීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක පාවිච්චි කරනු ලබන යම් අලුත් ප්‍රාග්ධන වත්කම් කිසිවක් අත්කර ගැනීම සඳහා පාවිච්චි කරනු ලබන අවස්ථාවක, අලුත් ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීමේ පිරිවැය, ඒ අලුත් ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීමේ සැබෑ පිරිවැය සහ ඒ විකිණීමෙන් ලත් මුදල අතර වෙනස ලෙස සළකනු ලැබිය යුතු ය ;

(ii) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ප්‍රයෝ-ජනය සඳහා ඒ තැනැත්තා විසින් මිලට ගැනීමෙන් නොවන අන්‍යා-කාරයකින් යම් පිරියතක්, යන්ත්‍රයක් හෝ සවි කිරීම්, අත්කර ගනු ලබන අවස්ථාවක, ඒ පිරියත, යන්ත්‍රය හෝ සවි කිරීම් අත්කර ගැනීමේ පිරිවැය ඒ අත්කර ගැනීමේ දිනයෙහි ඒ පිරියතෙහි, යන්ත්‍රයෙහි හෝ සවිකිරීම්වල වෙළෙඳ අගය විය යුතු ය ;

(iii) තනිවම හෝ වෙනත් අය සමඟ හවුල් ව්‍යාපාරයක් වශයෙන් පුද්ගලයකු විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක ප්‍රාග්ධන වත්කම් 14 වන වගන්තියේ (xv) වන ඡේදයෙහි සඳහන් සමාගමකට 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව පවරනු ලබන අවස්ථාවක, ඒ සමාගම විසින් ඒ ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීමේ පිරිවැය ඒ පුද්ගලයාට හෝ හවුල් ව්‍යාපාරයට (1) වන උපවගන්තිය යටතේ ක්ෂයවීම සඳහා ප්‍රදානය කරනු ලැබූ දීමනාවක මුදලින් අඩු කරනු ලැබූ මුදල ඒ පුද්ගලයා විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් ඒ ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීමේ පිරිවැය

ලෙස සලකනු ලැබිය යුතුය. තවද ඒ ඒ ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීමේ දිනය, ඒ පුද්ගලයා විසින්, හෝ හවුල් ව්‍යාපාරය විසින් ඒ ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීමේ දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.''.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ (ජ) ඡේදයේ ''1984 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු'' යන ඉලක්කම් සහ වචන වෙනුවට, ''1984 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසු එහෙත් 1987 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර'' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්, සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ජ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

'' (ජජ) (අ) යම් ගිවිසුමක් යටතේ ගෙවිය යුතු සම්පූර්ණ බදු කුලියෙන් තුනෙන් එකකට සමාන මුදලක් ඉක්මවන්නා වූ (ආ) ඡේදයේ සඳහන් පිරියතක්, යන්ත්‍රයක් හෝ සවි කිරීමක් හෝ උපකරණ නොවන යම් පිරියතක්, යන්ත්‍රයක්, සවි කිරීමක් හෝ උපකරණයක් ; සහ

(ආ) යම් ගිවිසුමක් යටතේ ගෙවිය යුතු සම්පූර්ණ බදු කුලියෙන් හතරෙන් එකකට සමාන මුදලක් ඉක්මවන්නා වූ යම් මෝටර් වාහනයක්, ලොරියක්, බස් රථයක්, ට්‍රැක්ටරයක් ට්‍රේලරයක් සහ කාර්යාල ගෘහ භාණ්ඩ

සම්බන්ධයෙන් 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඔහු විසින් ඇතුලත් වූ යම් ගිවිසුමක් යටතේ ඔහු විසින් යම් වර්ෂයක දී ගෙවන ලද බදු කුලියේ කොටස.''.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන අනුඡේදයෙහි ''1985 නොවැම්බර් මස 15 වන දින'' යන ඉලක්කම් සහ වචන පෙළෙහි සිට කිසිම අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය'' යන වචන පෙළ දක්වා සියලු වචන සහ ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

''1985 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව, අන්තිම කැමති පත්‍රයක් මගින් හෝ අන්තිම කැමති පත්‍රයක් නොමැතිව හෝ සිදු වූ අනුප්‍රාප්තියක් වශයෙන් වූවක් හැර අයිතියේ වෙනසක් සිදු වී ඇති සමාගමක් විසින් දරන ලද පාඩුවක් සම්බන්ධයෙන්, මේ ඡේදය යටතේ හෝ (3) (ආ) වන උපවගන්තිය යටතේ හෝ (4) (ආ) වන උපවගන්තිය යටතේ හෝ (4) (ඇ) වන උපවගන්තිය යටතේ හෝ කිසිම අඩු කිරීමක් ඒ පාඩුව සිදු වූ සමාගමේ වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක හෝ ව්‍යවස්ථාපිත ආදායමට අදාළව මිස නොකරනු ලැබිය යුතුය.''.

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (අ) ඡේදයේ අන්තිමට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

''(iii) 1987 අප්‍රේල් මස 1 වන දිනයට පසු යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකුගේ ආදායමෙහි එක් ප්‍රාග්ධන ලාභයකට වඩා ප්‍රාග්ධන ලාභ ඇතුළත් වන අවස්ථාවක අදාළ වෙතොත් 32 වන වගන්තියේ (3) (අ) වන උපවගන්තියේ සහ (3) (ආ) වන

උපවගන්තියේ සඳහන් අඩුම අනුප්‍රමාණය අනුව බදු අයකළ හැකි ප්‍රාග්ධන ලාභයෙන් ද ඉන් පසුව, අදාළ වෙතොත්, ඊළඟ ඉහළ අනුප්‍රමාණය අනුව යනාදී වශයෙන් ද ඒ අඩු කිරීම කළ යුතුය.''.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අන්තිමට පහත දැක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''එසේම තවදුරටත් 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සේවා නියුක්තයන් විසින් පමණක් දායක මුදල් ගෙවනු ලබන්නා වූ යම් සකසුරුවම්, ඉතිරි කිරීමේ හෝ ගොඩනැගිලි සමිතියක හෝ සුභසාධක අරමුදලක බදු අය කළ හැකි ආදායම, රුපියල් විසිහත් දහසක දීමනාවක් අඩු කිරීමෙන් පසුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමිතියේ හෝ අරමුදලෙහි බදු අයකළ හැකි ආදායම විය යුතු ය.''.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ 2 වන උපවගන්තියෙහි—

(අ) (ඌඌඌ) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ඌඌඌඌ) ස්වයං රැකියාවල නියුතු වූ තැනැත්තන් සඳහා වූ ද කොමසාරිස් ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා අනුමත කරන ලද්දාවූ ද අර්ථසාධක අරමුදලකට දායක මුදල් වශයෙන් යම් පුද්ගලයකු විසින් 1987 අප්‍රේල් මස 1 වන දින දී හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක්;'',

(ආ) (ච) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ජ) යම් පුද්ගලයකු විසින් තමා සඳහා හෝ තම කලත්‍රයා සඳහා හෝ තමාගේ දරුවකු සඳහා හෝ මව්පියන්ගෙන් කෙනෙකු සඳහා ආරෝග්‍යශාලාවක හෝ චිකිත්සාගාරයක නේවාසිකව ප්‍රතිකාර ගැනීමෙහිලා 1987 අප්‍රේල් මස 1 වන දින දී හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී වෛද්‍ය වියදම් වශයෙන් වැය කරන ලද යම් මුදල් ප්‍රමාණයක්,'' ;

(2) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන් :—

''එසේ වුවද යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් එකී දීමනාව අඩුකොට ඇති අවස්ථාවක දී සහ ඒ තැනැත්තා විසින්—

(අ) එකී කොටස් විකුණා ඇත්තේ නම් ; හෝ

(ආ) ඒ තැනැත්තාගේ පාලනයෙන් පරිබාහිර වූ පරිවේෂණ මත එකී කොටස් සම්බන්ධයෙන් යම් මුදල් ප්‍රමාණයක් ආපසු ලබාගෙන, උපලබ්ධ කොට ගෙන හෝ ලබාගෙන ඇත්තේ නම්

සහ ඒ විකිණීමෙන් ලත් මුදල් හෝ ආපසු ලබාගත්, උපලබ්ධ කොටගත් හෝ ලබාගත් මුදල් යම් අනුමත ව්‍යවසායක (එවකට පවත්නා කොටස හැර) වෙනත් සාමාන්‍ය කොටස් මිළ දී ගැනීම සඳහා—

(i) ඒ විකිණීම, ආපසු ගැනීම, උපලබ්ධවීම හෝ ලබා ගැනීම 1986 නොවැම්බර් මස 12 වන දිනට පෙර සිදු වූයේ නම් එකී විකිණීමේ, ආපසු ගැනීමේ, උපලබ්ධවීමේ හෝ ලබාගැනීමේ දින සිට මාස තුනක් ඇතුළත දී ; හෝ

(ii) ඒ විකිණීම, ආපසු ගැනීම හෝ උපලබ්ධවීම හෝ ලබා ගැනීම 1986 නොවැම්බර් මස 12 වන දිනට පසු සිදු වූයේ නම් එකී විකිණීමේ, ආපසු ගැනීමේ, උපලබ්ධවීමේ හෝ ලබාගැනීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත දී

යොදවන ලද්දේ නම් ඒ තැනැත්තා විෂයෙහි අතිරේක තක්සේරුවක් නොකරනු ලැබිය යුතු ය.'' ;

(3) ඒ වගන්තියේ (7අ) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

''(7අ) යම් සමාගමක යම් කොටස් මිලට ගැනීමක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ වූ දීමනාවක් අනුව තම තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීමකට හිමිකම් ලබන යම් තැනැත්තකු විසින්, තම පාලනයට පරිබාහිර වූ පරිවේෂණ යටතේ ඒ කොටස විකුණනු ලැබූ හෝ ඒ කොටස් සම්බන්ධයෙන් යම් මුදලක් ආපසු ගෙන හෝ උපලබ්ධ කොටගෙන හෝ ලබාගෙන, ඒ විකිණීමෙන් ලත් මුදල් හෝ එසේ ආපසු ගත්, උපලබ්ධ කොට ගත් නැතහොත් ලබාගත් මුදල්—

(අ) ඒ විකිණීම, ආපසු ලබාගැනීම, උපලබ්ධ කොට ගැනීම හෝ ලබාගැනීම 1986 නොවැම්බර් මස 12 වන දිනට පෙර කරන ලද්දේ නම්, ඒ විකිණීමේ, ආපසු ලබා ගැනීමේ, උපලබ්ධ කොට ගැනීමේ හෝ ලබා ගැනීමේ දින සිට මාස තුනක් ඇතුළත දී ; හෝ

(ආ) ඒ විකිණීම, ආපසු ලබා ගැනීම, උපලබ්ධ කොට ගැනීම හෝ ලබා ගැනීම 1986 නොවැම්බර් මස 12 වන දිනට පසු කරන ලද්දේ නම්, ඒ විකිණීමේ, ආපසු ලබා ගැනීමේ, උපලබ්ධ කොට ගැනීමේ හෝ ලබා ගැනීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත දී

ඒ උපවගන්තිය යටතේ ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීමට ඔහුට හිමිකම් ලැබෙන ආකාරයේ වෙනත් සාමාන්‍ය කොටස් මිලට ගැනීම සඳහා ඔහු විසින් යොදවනු ලැබූ අවස්ථාවක දී, ඉහත දෙවනුව සඳහන් කොටස් මිලට ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආදායම් බද්දෙන් අඩු කිරීමට ඔහුට හිමිකම් ඇති මුදල් ප්‍රමාණයෙන් ඉහත පළමුව සඳහන් කොටස් මිලට ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආදායම් බද්දෙන් අඩු කිරීමට ඔහු හිමිකම් ලැබූ මුදල් ප්‍රමාණය අඩු කරනු ලැබිය යුතු ය.''.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ''යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායමට'' යන වචන වෙනුවට ''යම් දේපළක අයිතිය වෙනස් වීමෙන් 1986 නොවැම්බර් මස 12 වන දින හෝ ඉන් පසුව උද්ගතවන ප්‍රාග්ධන ලාභයක් නොවන්නා වූ ප්‍රාග්ධන ලාභයක් යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායමට'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(3අ) යම් තැනැත්තකු විසින් යම් දේපළක් අත්කර ගැනීමෙන් වර්ෂ දෙකකට වැඩි එහෙත් වර්ෂ පහකට අඩු කාලයක් ගතවීමෙන් පසුව ඒ දේපළෙහි අයිතිය වෙනස් වීමෙන් 1986 නොවැම්බර් මස 12 වන දින හෝ ඉන් පසුව උද්ගත වන යම් ප්‍රාග්ධන ලාභයක් ඒ තැනැත්තාගේ බදු අය කළ හැකි ආදායමෙහි ඇතුළත් වන්නා වූ ද (මේ උපවගන්තියෙහි මින්මතු ''ආදායමේ අදාළ කොටස'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ ආදායමේ ඒ කොටස මත ගෙවිය යුතු ආදායම් බදු අනුප්‍රමාණය සියයට විසි පහක් ඉක්මවන්නා වූ ද අවස්ථාවක ආදායමේ අදාළ කොටස සම්බන්ධයෙන් වන බද්ද පහත දැක්වෙන පරිදි ගණන් ගනු ලැබිය යුතු ය :—

(අ) ආදායමේ අදාළ කොටස ඒ ප්‍රාග්ධන ලාභවල මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම්—

(i) ආදායමේ අදාළ කොටසින් යම් කොටසක් ඒ ප්‍රාග්ධන ලාභයේ මුදලට සමාන වන්නේ ද ඒ කොටස මත ගෙවිය යුතු බද්ද සියයට විසිපහක අනුප්‍රමාණය අනුව විය යුතු ය ; තවද

(ii) ආදායමේ අදාළ කොටසේ ශේෂය මත ගෙවිය යුතු බද්ද, මේ පනත යටතේ ඊට අදාළ කළ යුතු සියයට විසිපහට වැඩි අනුප්‍රමාණයන් අනුව ගණන් බලනු ලැබිය යුතු ය ; තවද

(ආ) ආදායමේ අදාළ කොටස ශුද්ධ ප්‍රාග්ධන ලාභයේ ප්‍රමාණයට වැඩි නොවේ නම්, ආදායමේ සම්පූර්ණ අදාළ කොටස මත ගෙවිය යුතු බද්ද, මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, සියයට විසිපහක් විය යුතු ය.

(3ආ) යම් තැනැත්තකු විසින් යම් දේපළක් අත්කර ගනු ලැබීමෙන් පසු, මෙහි I වන තීරයේ සඳහන් කාලපරිච්ඡේදයක් තුළ දී ඒ දේපළෙහි අයිතිය වෙනස්වීම හේතු කොට ගෙන ඒ තැනැත්තාගේ බදු අය කළ හැකි ආදායමට 1986 නොවැම්බර් මස 12 වන දින දී හෝ ඉන් පසු උද්ගත වන යම් ප්‍රාග්ධන ලාභයක් ඇතුළත් වන අවස්ථාවක දී, ඒ ප්‍රාග්ධන ලාභය මත ආදයම් බද්ද ගණන් බැලීමේ දී (3අ) වන උපවගන්තියේ දැක්වෙන ''සියයට විසිපහ'' යන සඳහන වෙනුවට මෙහි II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන සඳහන ආදේශ කරනු ලැබූ පරිද්දෙන් (3අ) වන උපවගන්තියේ විධි විධාන අදාළ කරනු ලැබිය යුතු ය.

| I වන තීරය | II වන තීරය |
|---|---|
| අවුරුදු පහකට වැඩි එහෙත් අවුරුදු පහළොවකට අඩු කාල පරිච්ඡේදයක් ... | සියයට 17½ |
| අවුරුදු පහළොවකට වැඩි එහෙත් අවුරුදු විස්සකට අඩු කාල පරිච්ඡේදයක් ... | සියයට 12½ |
| අවුරුදු විස්සකට වැඩි එහෙත් අවුරුදු විසිපහකට අඩු කාල පරිච්ඡේදයක් ... | සියයට 5''. |

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ ''ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගල මණ්ඩලයක් විසින්'' යන වචන වෙනුවට ''1987 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යම් තක්සේරු වර්ෂයක දී ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගල මණ්ඩලයක් විසින්'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

''(5) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම, ආණ්ඩුවේ සුරැකුම්පත් වල අනුමත කළ අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලක් විසින් කරන ලද ආයෝජන නොවන ආයෝජනවල මුදල් ආයෝජනය කර ඇති සෑම අර්ථ සාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලකම ආයෝජන වලින් ලැබෙන ආදායමෙන් සියයට විස්සක ආදායම් බද්දක් ඒ තක්සේරු වර්ෂය සඳහා අය කරනු ලැබිය යුතු ය.

(6) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම, සාමාජිකයන් විසින් දායක මුදල් ගෙවනු ලබන සෑම සකසුරුවම්, ඉතිරි කිරීම් හෝ ගොඩනැගිලි සමිතියකම හෝ ශුභසාධක අරමුදලකම ආයෝජන වලින් ඒ සමිතියට ඒ වර්ෂයේදී ලැබෙන ආදායමෙන් රුපියල් විසිහත් දහස ඉක්මවන කොටස සඳහා සියයට දහයක ආදායම් බද්දක් එවැනි ආයෝජන ආදායමින් අයකර ගනු ලැබිය යුතු ය.''.

**16.** 32අ වගන්තියේ (3) වන උපවගන්තියේ ''රාජ්‍ය සංස්ථාව'' යන යෙදුමේ අර්ථකථනය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) (අ) ඒ වගන්තියේ (1අ) උපවගන්තියේ (අ) ඡේදයේ ''1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු'' යන ඉලක්කම් සහ වචන වෙනුවට ''1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු එහෙත් 1986 නොවැම්බර් මස 12 වන දිනට පෙර'' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්, සහ

(ආ) ඒ වගන්තියේ (1ආ) උපවගන්තියේ (ආ) ඡේදයේ ''1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු'' යන ඉලක්කම් සහ වචන වෙනුවට ''1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු එහෙත් 1986 නොවැම්බර් මස 12 වන දිනට පෙර'' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;'' ;

(2) ඒ වගන්තියේ (1ආ) උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(1ඇ) 1986 නොවැම්බර් මස 12 වන දිනයෙන් ආරම්භ වන කාලසීමාව සඳහා සමාගමක බදු අයකළ හැකි ආදායමෙහි යම් ප්‍රාග්ධන ලාභයක් ඇතුළත් වන අවස්ථාවක්, 32 වන වගන්තියේ (3අ) සහ (3ආ) උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ ප්‍රාග්ධන ලාභය සම්බන්ධයෙන් බදු අය කිරීමට අදාළ විය යුතුය.'' ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්—

''(අඅ) තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, ''නිල ලැයිස්තු ගත පොදු සමාගම'' යන්නෙන්, ශ්‍රී ලංකාවේ නේවාසික වූ ද තක්සේරු වර්ෂය පුරාම හෝ සමාගම සංස්ථා ගත කරන ලද දිනයේ සිට ඒ තක්සේරු වර්ෂයේ අවසානය දක්වා වූ කාලය තුළ හෝ සමාගමේ කොටස්වල මිළ ගණන් සඳහන් කොට ඇති බවට තක්සේරුකරු සෑහීමට පත් වන්නා වූ ද සමාගමක් අදහස් වේ.''.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ (ඍ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ: —

''(ඍඍ) 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත මගින් ඇති කරන ලද ජාතික ආරක්ෂක අරමුදල.''.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (න) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:

''(න) 10 වන වගන්තියේ (ඉ) වන උපවගන්තියේ සඳහන් වන යම් ගිණුමක ඔහුගේ බැරට ඇති මුදල්.''.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ, '' ආණ්ඩුවට හෝ 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතින් පිහිටුවන ලද ජනාධිපතිවරයාගේ අරමුදලට හෝ යම් පළාත් පාලන ආයතනයකට '' යන වචන සහ ඉලක්කම් වෙනුවට '' ආණ්ඩුවට හෝ 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතින් පිහිටුවන ලද ජනාධිපතිවරයාගේ අරමුදලට හෝ 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද ජාතික ආරක්ෂක අරමුදලට හෝ යම් පළාත් පාලන ආයතනයකට '' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, '' හය වන උප ලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණය අනුව '' යන වචන වෙනුවට '' හය වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණය අනුව හෝ ද්විත්ව බදු ගෙවීමෙන් සහනය සැලසීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ඒ තැනැත්තා පදිංචි හෝ ඒ හවුල් ව්‍යාපාරය පිහිටි දේශයේ ආණ්ඩුව අතර බලපවත්නා ගිවිසුමක් පවතින කල්හි ඒ ගිවිසුමෙහි සඳහන් උචිත අනුප්‍රමාණය අනුව '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ, '' හයවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණය නොවන '' යන වචන වෙනුවට, '' අවස්ථාවෝචිත පරිදි, හයවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණ නොවන හෝ ද්විත්ව බදු ගෙවීම සඳහා සහනය සලසන ගිවිසුමෙහි සඳහන් අනුප්‍රමාණ නොවන '' යන වචන ආදේශ කිරීමෙන්.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) '' සියයට හැත්තෑ පහක් '' යන වචන වෙනුවට '' 1987 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට සියයට හැත්තෑ පහක, හෝ 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට සියයට පනහක හෝ '' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) '' වර්ෂ දහයක කාල පරිච්ඡේදය '' යන වචන වෙනුවට 1987 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට වර්ෂ දහයක කාල පරිච්ඡේදය තුළ හෝ 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට වර්ෂ පහක කාල පරිච්ඡේදය තුළ '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) '' ඉහත සඳහන් වර්ෂ දහයේ කාල පරිච්ඡේදයේ '' යන වචන වෙනුවට '' ඉහත සඳහන් වර්ෂ දහයේ හෝ පහේ කාල පරිච්ඡේදයේ '' යන වචන ආදේශ කිරීමෙන්.

**23**. ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ' රුපියල් පන්දහසක් ' යන වචන වෙනුවට ' රුපියල් පනස් දහසක් ' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**24**. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (1) (අ) මාසයකට රුපියල් දෙදහස් දෙසිය පනහකට හෝ වර්ෂයකට රුපියල් විසිහත් දහසකට වැඩි පාරිශ්‍රමිකයක් ලබන යම් පුද්ගලයකු ; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි කරනු ලබන සේවය වෙනුවෙන් මාසයකට රුපියල් අසූපහකට හෝ වර්ෂයකට රුපියල් එක් දහසකට වැඩි පාරිශ්‍රමිකයක් ලබන යම් නිර්වාසික තැනැත්තකු

සේවයෙහි නියුක්ත කරන්නා වූ ද, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 107 ඇ (1) වන වගන්තිය යටතේ සහ මේ පනතේ මේ කොටස යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දීමක් කර නොමැත්තා වූද, සෑම සේවායෝජකයකු විසින් ම, (මේ පරිච්ඡේදයෙහි මින් මතු '' නියමිත සේවා නියුක්තයා '' යනුවෙන් සඳහන් කරනු ලබන) එවැනි යම් තැනැත්තකු තම සේවයෙහි සිටින බව 1987 ජූනි මස 15 වන දින නොඉක්මවා කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දීමක් කළ යුතු ය.''.

**25**. ප්‍රධාන ප්‍රඥප්තියේ 113 අ වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි '' මේ වගන්තිය යටතේ අඩු කිරීමක කාර්ය සඳහා '' යන වචන සිට '' ඒ කොටස අදහස් වේ '' යන වචන දක්වා වූ සියලු වචන ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' මේ වගන්තිය යටතේ අඩු කිරීමක කාර්යය සඳහා, පොළිය යන්නෙන් යම් තක්සේරු වර්ෂයක දී, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ නොමැත්තා වූ හෝ ඒ සම්බන්ධයෙන් 81 වන වගන්තිය යටතේ අඩු කිරීමක් කරනු නොලැබුවා වූ හෝ—

(අ) ආදායම් බදු අය කරනු ලැබිය යුතු තැනැත්තකු බැංකුවකින් හෝ මුදල් ආයතනයකින් ලබාගත් පොළිය ; සහ

(ආ) බැංකුවකින් හෝ මුදල් ආයතනයකින් නිකුත් කරන ලද ආණ්ඩුවේ සුරැකුම්පතක් නොවන බැඳුම්කරයක් වෙනුවෙන් පොළිය හෝ වට්ටම් වශයෙන් ඒ තැනැත්තා විසින් ලබාගත් මුදල් ප්‍රමාණය

අදහස් වේ.''.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තියේ අගට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (12) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඒ දිනයට පසුව මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචන පෙත්සමක් ම, එම අභියාචනය සම්බන්ධයෙන් වෙනස් කිරීමක් නැතහොත් තීරණයක් කිරීම, අභියාචක හෝ කොමසාරිස් ජනරාල්වරයා හෝ තක්සේරු-කරුවකු හැර වෙනත් තැනැත්තකු, විසින් යම් ලේඛනයක් සපයනු ලැබීම හෝ යම් ක්‍රියා මාර්ගයක් ගනු ලැබීම මත පවතින්නේ නම් මිස, එම අභියාචනා පෙත්සම කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුණු දිනයේ සිට අවුරුදු දෙකක් ඇතුළත දී එකඟත්වයකට පත් කරනු ලැබිය යුතු ය ; නැතහොත් තීරණය කරනු ලැබිය යුතු ය. එම කාලසීමාව ඇතුළත දී එම අභියාචනය එකඟත්වයට පත් කරනු නොලබන්නා වූ හෝ තීරණය කරනු නොලබන්නා වූ යම් අවස්ථාවක එම අභියාචනයට ඉඩ දී ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බදු අය කරනු ලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ ලැබෙන සෑම අභියාචනයක් ම ලැබුණු බව දැනුම් දිය යුතු ය. තවද, එසේ දැනුම් දීමේ ලිපියේ දිනය මේ වගන්තියේ කාර්ය සඳහා, ඒ අභියාචනය ලැබුණු දිනය වශයෙන් සලකනු ලැබිය යුතුය.

(13) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන තීරකවරයන්ගේ මූල මණ්ඩලයක් විය යුතු ය. තීරකවරයන්ගේ මූල මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය. මේ පරිච්ඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති බලතලවලින් බලය දීමෙහි සඳහන් කරනු ලබන කවර හෝ බලයක්, එවැනි යම් තීරකවරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබිය හැකි ය.''.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියේ 1 වන උපවගන්තියේ '' රුපියල් හත් දහස් පන් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය '' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

'' 92 (1) වන වගන්තිය අනුව හෝ 92 (2) වන වගන්තිය යටතේ දෙන ලද දැන්වීමක නියමයක් අනුව හෝ කටයුතු කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී, රුපියල් පනස් දහසකට නො වැඩි දඩයකට සහ වෙනත් යම් අවස්ථාවක දී රුපියල් හත් දහස් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.''.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) '' බලයලත් නියෝජිතයා '' යන්නෙහි අර්ථකථනයේ (2) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

''(2) බලය දීමේ ලියවිල්ලෙහි සඳහන් තක්සේරු වර්ෂයට අදාළ කාරණා සම්බන්ධයෙන් මේ පනතේ කාර්ය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස යම් තැනැත්තකු විසින් කලින් කල ලියවිල්ලකින් බලය දෙනු ලැබූ සහ—

(i) සමාගම් (විගණකවරයන්ගේ) නියෝග යටතේ විගණකවරයකු ලෙස ලියාපදිංචිව සිටින පුද්ගලයකුට කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ; හෝ

(ii) තත්කාර්යය සඳහා සාදන ලද නියෝගය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ පුද්ගලයකු වන්නා වූ හෝ

පුද්ගලයෙක් අදහස් වේ.'' ;

(2) '' කොමසාරිස් ජනරාල්වරයා '' යන වචනවල අර්ථකථනය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'' කොමසාරිස් ජනරාල්වරයා '' යන්නෙන් මේ පනත යටතේ පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ ලෙස සැලකෙන හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වන අතර, ඊට—

(අ) මේ පනතේ යම් විධිවිධානයක් සම්බන්ධයෙන් වූ විට, කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් පොදුවේ හෝ, නිශ්චිත කාර්යයක් සඳහා හෝ වැඩ බැලීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් විශේෂයෙන්ම බලය දෙනු ලැබූ කොමසාරිස්-වරයකු සහ නියෝජ්‍ය කොමසාරිස්වරයකු ඇතුළත් වේ ; තවද

(ආ) xviii වන පරිච්ඡේදය සම්බන්ධයෙන් වූ විට, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබ ඒ පරිච්ඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ තීරකවරයකු ඇතුළත් වේ ; සහ

(3) '' දේපළ '' යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'' රාජ්‍ය සංස්ථාව '' යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනත හැර, වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවනු ලැබුවා වූ හෝ ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු ප්‍රාග්ධනය හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;''.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයෙහි අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්, එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''**VIII** වන කොටස

**රාජ්‍ය සංස්ථා**

| | |
|---|---|
| රාජ්‍ය සංස්ථා | සියයට 50 යි.''. |

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයෙහි 10 වන විෂය ඉවත් කිරීමෙන් ඒ උප-ලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**31.** මේ පනතේ 3 වන වගන්තියෙන්, 7 වන වගන්තියේ (4) වන උපවගන්තියෙන්, 18 වන වගන්තියෙන් සහ 20 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1985 මාර්තු මස 21 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

# 1987 අංක 9 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 මාර්තු මස 6 වන දින]

**1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1987 අංක 9 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින්මතු '' ප්‍රධාන ප්‍රඥප්තිය '' යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 5 වන වගන්තියේ අන්තිමට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (4) යම් කාර්තුවක් සඳහා ව්‍යාපාරයක පිරිවැටුම නිසැක වශයෙන් දැන ගැනීමේ දී කලින් කාර්තුවක් සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුමෙහි ඇතුළත් කරනු ලැබ ඇත්තා වූ ද සහ ඒ සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද ගෙවනු ලැබ ඇත්තා වූ මුදලක් වන, ඒ කාර්තුව තුළ බොල් ණයක් වී ඇත්තා වූ ඒ ව්‍යාපාරය විසින් දරන ලද යම් බොල් ණයකට සමාන මුදලක් අඩු කරනු ලැබිය යුතු ය.

එසේ වුවද බොල් ණයක් සම්බන්ධයෙන් මේ උපවගන්තිය යටතේ කලින් අඩු කරනු ලැබූ මුදලක් වෙනුවෙන් ඒ ව්‍යාපාරය විසින් භාර ගනු ලැබූ යම් මුදලක් ඒ මුදල් භාරගනු ලැබූවේ යම් කාර්තුවක දී ද ඒ කාර්තුව සඳහා වූ ඒ ව්‍යාපාරයේ පිරිවැටුමෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය.''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

6. 3 වන වගන්තියේ හෝ 10 වන වගන්තියේ කාර්ය සඳහා ව්‍යාපාරයක පිරිවැටුම තීරණය කිරීමේ දී—

(අ) තැනැත්තකු විසින්, එකම ස්ථානයක හෝ වෙනස් ස්ථානවල පවත්වා ගෙන යනු ලබන සමාන ස්වභාවයක ව්‍යාපාර එක් ව්‍යාපාරයක් සේ සලකනු ලැබිය යුතු ය ; තවද

(ආ) එකම තැනැත්තා විසින් එක් ස්ථානයක පවත්වාගෙන යනු ලබන වෙනස් ව්‍යාපාර එක් ව්‍යාපාරයක් සේ සලකනු ලැබිය යුතු ය.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ '' ස්වභාවය අනුව නිශ්චය කරනු ලැබීම ද '' යන වචන වෙනුවට '' ස්වභාවය අනුව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබීම ද '' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ අන්තිමට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (9) (2) වන උපවගන්තිය යටතේ තක්සේරුකරුවකු විසින් යම් තැනැත්තකුට දෙන ලද දැන්වීමක නියමයන් අනුව කටයුතු කිරීමට ඔහු පැහැර හරින අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින්—

(අ) ඒ තැනැත්තා මත රුපියල් පන් දහසක් නොඉක්මවන දණ්ඩනයක් පැනවිය හැකි ය ; තවද

(ආ) (i) ඒ දඩ ගෙවීමට ; සහ

(ii) තක්සේරුකරු විසින් ඒ තැනැත්තාට දෙන ලද දැන්වීමෙහි සඳහන් වන වාර්තාව කොමසාරිස් ජනරාල්වරයාගේ දැන්වීමෙහි සඳහන් යම් කාලයක් ඇතුළත සැපයීමට

ඒ තැනැත්තාට නියම කළ හැකි ය.''.

(10) යම් තැනැත්තකු විසින් වාර්තාවක් සැපයීම පැහැර හැරීමට හේතුව තම පාලනයෙන් බාහිර වූ අවස්ථානුගත කරුණු නිසා බවට සහ දණ්ඩනය නියම කිරීමෙන් පසුව තමා විසින් ඒ වාර්තාව සපයා ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඒ තැනැත්තා වෙත ඔප්පු කරනු ලැබුවහොත්, මේ වගන්තිය යටතේ ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කරනු ලැබිය හැකි ය ; නැතහොත් අත්හරිනු ලැබිය හැකි ය.

(11) (9) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දණ්ඩනයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දැන්වීමට අදාළව 53 වන වගන්තිය යටතේ වරදක් සඳහා වූ අපරාධ චෝදනාවකට ඒ තැනැත්තා යටත් නොවිය යුතු ය.''.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (1) මේ පනතේ කුමක් සඳහන් වුවද (8 වන වගන්තියේ අර්ථානුකූලව බැහැර කරන ලද දෙයක් නොවන්නා වූ) ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදන ලද යම් භාණ්ඩයක් ආනයනය කරන සෑම තැනැත්තකුගෙන්ම, යම් කාර්තුවක් සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුම 3 වන වගන්තියේ සඳහන් මුදලට වඩා අඩුවුවද, නුවුවද, 7 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන අනුප්‍රමාණ අනුව ඔහුගේ පිරිවැටුම් සම්බන්ධයෙන් පිරිවැටුම් බද්දක් අයකරනු ලැබිය යුතු අතර, ඒ පිරිවැටුම් බද්ද ප්‍රධාන රේගු අයකැමි විසින් එකතු කළ යුතුය. මේ වගන්තිය යටතේ පනවනු ලබන බද්ද රේගු ආඥාපනත යටතේ පනවනු ලබන වෙනත් යම් බද්දකට තීරු ගාස්තුවකට හෝ ගාස්තුවකට අමතරව විය යුතු ය.''.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ '' යම් තැනැත්තකුගෙන් '' යන වචන සිට '' එම කාර්තුව සඳහා බද්ද ගෙවීමට අපොහොසත් වන විටක '' යන වචන තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' තක්සේරුකරුවකුගේ මතය අනුව යම් තැනැත්තකුගේ පිරිවැටුම් බදු අයකර ගත යුතු වන්නේද ඒ තැනැත්තා විසින් 9 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයීම සහ ඒ කාර්තුව සඳහා බද්ද ගෙවීම පැහැර හරින අවස්ථාවක.''.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි '' මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමග ඒ තක්සේරුව මගින්, හෝ අතිරේක තක්සේරුව මගින් අයකරන ලද පිරිවැටුම් බද්ද ගෙවිය යුතු ය.'' යන වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

'' ඒ අභියාචනය තීරණය කරනු ලබන තෙක්, පිරිවැටුම් බද්ද හෝ එහි යම් කොටසක්, හෝ ගෙවීම කල් තබනු ලැබිය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබුවහොත් මිස, මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමඟ ඒ තක්සේරුව මගින් හෝ අතිරේක තක්සේරුව මගින් අය කරන ලද පිරිවැටුම් බද්ද ගෙවිය යුතු ය. ඒ නියමය කරනු ලැබූ විට කල් තබනු ලැබූ පිරිවැටුම් බද්දෙහි මුදල හෝ එහි කොටස් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.'' ; තවද

(2) ඒ වගන්තිය අන්තිමට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

'' (12) අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කරනු ලැබීම මත හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබූ නියමයක් මත (1) වන උපවගන්තිය යටතේ කල් තබනු ලැබූ යම් පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක, හෝ මුල් තක්සේරුවෙන් අයකරනු ලැබූ පිරිවැටුම් බද්ද වැඩිකරනු ලැබූ අවස්ථාවක, එවැනි යම් පිරිවැටුම් බද්දක් හෝ පිරිවැටුම් බද්දෙහි ශේෂය ගෙවිය යුත්තේ යම් දිනයක ද නැතහොත් ඊට පෙරද, ඒ දිනය නියම කෙරෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචකට දෙනු ලැබිය යුතු ය. එසේ ගෙවනු නොලැබූ යම් පිරිවැටුම් බද්දක් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(13) යම් තක්සේරුවකට විරුද්ධව අභියාචනයක් කර ඇත්තා වූ අවස්ථාවක සහ තක්සේරුව පිළිබඳ දැන්වීමෙහි සඳහන් යම් පිරිවැටුම් බද්දක් ගෙවීම (1) වන උපවගන්තිය යටතේ කල්තබා ඇත්තාවූ අවස්ථාවක, ඒ අභියාචනය සම්බන්ධයෙන් පරීක්ෂණයක් අතරතුර හෝ ඒ අභියාචනය විභාග කිරීමේ දී ඒ තක්සේරුව සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද වශයෙන් යම් මුදලක් ගෙවිය යුතු බවට හෝ ගෙවිය යුතු විය හැකි බවට අභියාචක එකඟ වෙතොත්, කොමසාරිස් ජනරාල්වරයා විසින්, අභියාචකට දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, එම දැන්වීමෙහි සඳහන් දින හෝ ඊට පෙර ඒ මුදල ගෙවීමට විධාන කරනු ලැබිය හැකි ය. එසේ ගෙවනු නොලැබූවා වූ යම් මුදලක් පැහැර හරිනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය.''.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ '' පිරිවැටුම් බද්ද '' යන වචන සිට '' අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.'' යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (20) පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් තක්සේරුවකට විරුද්ධව මේ පනතේ නියමිත කාලසීමාව තුළ වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක, හෝ ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් 17 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ එකඟ වී ඇති අවස්ථාවක, හෝ අභියාචනයේ දී නිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක, හෝ අභියාචනයේ දී, අවස්ථාවෝචිත පරිදි, කරන ලද හෝ එකඟ වන ලද හෝ අඩු කරන ලද හෝ වැඩි කරන ලද හෝ ස්ථිර කරන ලද තක්සේරුව ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.''.

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 29අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

29අ. යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙහි ප්‍රමාණය අඩුකරන්නා වූ හෝ අඩුකිරීමේ ප්‍රතිඵලය ගෙන දෙනු ලැබිය හැකි යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් කෘතිම බව හෝ ව්‍යාජ බව සහ යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් ඇත්ත වශයෙන් ම, ක්‍රියාත්මක කරනු නො ලබන බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, එවැනි යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් ඔහු විසින් සලකනු නොලැබිය හැකි අතර, ඒ අනුව ඒ ගනුදෙනුවට හෝ බැහැර කිරීමට අදාළ පාර්ශ්වයන් තක්සේරු කළ හැකි ය.

මේ වගන්තියෙහි '' බැහැර කිරීම '' යන්නට යම් භාරයක්, ප්‍රදානයක්, ප්‍රතිඥාවක්, ගිවිසුමක් හෝ සැකැස්මක් ඇතුළත් වේ.''.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'' (2) පැහැර හරිනු ලැබ ඇති පිරිවැටුම් බද්ද පැහැර හරින්නා මත කරන ලද තක්සේරුවක් සම්බන්ධයෙන් නම්, සහ පැහැර හරින්නා විසින් ඒ තක්සේරුවට විරුද්ධව වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති නම්, හෝ පැහැර හරින්නා විසින් සපයන ලද වාර්තාවකට අනුකූලව ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් නම් පැහැර හරින්නා විසින්, ඒ දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත, අය කරනු ලැබූ බද්ද සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත විරෝධතාවයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. තවද, 20 වන වගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වුව ද කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ විරෝධතා සලකා බලා ඒ පිළිබඳව ස්වකීය තීරණය දෙනු ලැබිය යුතු අතර, ඒ තීරණය අවසානාත්මක විය යුතු ය.''

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (1) වන උපවගන්තියේ '' යම් තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරු කරනු ලැබූ '' යන වචන වෙනුවට '' යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු '' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ '' නිෂ්පාදකයකු නොවන '' යන වචනවල සිට '' තමා එළඹුනු '' යන වචන දක්වා වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට '' සෑම තැනැත්තකු විසින් ම, තම ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී තමා එළඹුනු, 46 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ගනුදෙනුවක් නොවන '' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියට ඉක්බිති ව ම, පහත දැක්වෙන ශීර්ෂය ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

## "XIV අ වන පරිච්ඡේදය

## බැර සහ ආපසු ගෙවීම්."

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ " ලියා පදිංචි කළ සාදන්නකු විසින් එම කාර්තුව සඳහා " යන වචන වෙනුවට " ලියා පංදිචි කළ සාදන්නා විසින්, ඒ සෑදීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් එම කාර්තුව සඳහා " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (iv) වන ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (iv) ප්‍රසංගකරුවකුගේ හෝ කලාශිල්පියකුගේ සේවාවන් සැලසීම සඳහා වූ ගිවිසුමක් ඇතුළු එහෙත් සේවා නියුක්ති ගිවිසුමක් නොඇතුළු සේවය සැලසීම සඳහා වූ යම් ගිවිසුමක් අදහස් වේ.".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ " මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි " යන වචන සිට " යටත් විය යුතු ය " දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට 9 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක නියමයන් අනුව කටයුතු කිරීමට පැහැර හැරීමේ වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.".

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "තක්සේරුකරු " යන්නෙහි අර්ථකථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

" තක්සේරුකරු යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා පත් කරන ලද දේශීය ආදායම් තක්සේරුකරුවකු අදහස් වන අතර, ඒ පනතේ කාර්ය සඳහා පත් කරන ලද දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ඊට ඇතුළත් වේ.".

(2) " බලයලත් නියෝජිතයා " යන්නෙහි අර්ථකථනයේ (2) වන ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (2) බලය දීමට අදාළ යම් කාරණා සම්බන්ධයෙන් මේ පනතේ කාර්ය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස තැනැත්තකු විසින් කලින් කල ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූ ද 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද

යම් පුද්ගලයෙක් අදහස් වේ ; '' ;

(3) '' සමාගම '' යන්නෙහි අර්ථකථනයේ '' අදහස් වේ ; '' යන වචනය වෙනුවට '' අදහස් වන අතර, රාජ්‍ය සංස්ථාවක් ද ඊට ඇතුළත් වේ.'' යන වචන ආදේශ කිරීමෙන් ; තවද

(4) '' තැනැත්තා '' යන්නෙහි අර්ථකථනයේ '' පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ '' යන වචන වෙනුවට '' පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් ඊට ඇතුළත් වේ ; යන වචන ආදේශ කිරීමෙන්

## 1987 අංක 33 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 25 වන දින]

**1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1987 අංක 33 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ 87 වන වගන්තියෙහි '' අධ්‍යක්ෂවරයා '' යන අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

' '' භාරකරු '' යන්නෙන් බාල වයස්කරුවකු සම්බන්ධයෙන් වූ විට බාල වයස්කරුගේ පියා හෝ මව හෝ අදහස් වන අතර, පියා සහ මව ජීවතුන් අතර නොමැති අවස්ථාවක, බාල වයස්කරුගේ මුත්තා හෝ අත්තම්මා හෝ තත් කාලයෙහි බාල වයස්කරු සිටින්නේ යම් තැනැත්තකුගේ ආරක්ෂාව සහ නීත්‍යානුකූල භාරය යටතේ ද ඒ තැනැත්තා හෝ අදහස් වේ.'.

## 1987 අංක 36 දරන සුරැකුම්පත් සභා පනත

[සහතිකය සටහන් කළේ 1987 අගෝස්තු මස 27 වන දින.]

**ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළෙඳපොළ විධිමත් කිරීමේ කාර්ය සඳහා සුරැකුම්පත් සභාව පිහිටුවීම සඳහා ද සුරැකුම්පත් වෙළෙඳ ව්‍යාපාරයෙහි යෙදෙන ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලට, ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට සහ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා ද වන්දි අරමුදලක් ඇති කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**1.** මේ පනත 1987 අංක 36 දරන සුරැකුම්පත් සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු '' නියමිත දිනය '' යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## i වන කොටස

## සුරකුම්පත් සභාව පිහිටුවීම හා එහි සංයුතිය

**2.** (1) (මෙහි මින් මතු " සභාව " යනුවෙන් සඳහන් කරනු ලබන) සුරකුම්පත් සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර එය, 3 වන වගන්තිය යටතේ එහි සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) සභාව, (1) වන උපවගන්තියෙන් ඊට දෙන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් ද, පොදු මුද්‍රාවක් ද තිබිය යුතු ය ; තව ද ඒ නාමයෙන් සභාව විසින් නඩු පැවරීම ද, ඊට විරුද්ධව නඩු පැවරීම ද කළ හැකි ය.

**3.** (1) සභාව, පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයෝ " යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන සාමාජිකයෝ—

(i) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන ඒ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙක් ; සහ

(ii) නෛතික, මූල්‍ය ව්‍යාපාර හෝ පරිපාලන කටයුතුවල පෘථුල පළපුරුද්දක් ඇති බවට සහ ඒ සම්බන්ධයෙන් දක්ෂතා ඇති බවට, අමාත්‍යවරයාට පෙනීයන තවත් තැනැත්තන් හය දෙනෙක් ; තව ද

(ආ) නිල බලයෙන් පත්වන පහත දැක්වෙන සාමාජිකයෝ—

(i) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධූරය තත් කාලයෙහි දරන තැනැත්තා ;

(ii) සමාගම් රෙජිස්ට්‍රාර් ධූරය තත් කාලයෙහි දරන තැනැත්තා ; සහ

(iii) 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය පනත මගින් පිහිටුවන ලද වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධූරය තත්කාලයේ දරන තැනැත්තා.

(2) අමාත්‍යවරයා විසින්, සභාවේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු සභාවේ සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

**4.** මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධූරය හිස් කරන්නේ නම් මිස, සභාවේ සෑම පත් කළ සාමාජිකයකු ම අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතු අතර ඔහු නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙක් විය යුතු ය.

**5.** (1) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් යම් පත් කළ සාමාජිකයකුට ස්වකීය ධූරයෙන් කවර හෝ අවස්ථාවක ඉල්ලා අස්විය හැකි වන අතර ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් භාරගත් විට ක්‍රියාත්මක විය යුතු ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් යම් පත් කළ සාමාජිකයකු කිසිම හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කළ හැකි අතර ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා සභාවේ යම් පත් කළ සාමාජිකයකුගේ ධුරය හිස් වුවහොත් අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන, වෙනත් තැනැත්තකු, ඒ තැනැත්තා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලපරිච්ඡේදය තුළ ධුර දැරීම සඳහා පත් කළ හැකිය.

(4) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ සභාවේ යම් පත්කළ සාමාජිකයකුට යම් කාලපරිච්ඡේදයක් තුළ ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ කාලපරිච්ඡේදය තුළ ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

**6**. අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක්, සභාවේ සාමාජිකයන්හට සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

**7**. (1) සභාවේ සභාපතිවරයා පැමිණ සිටී නම්, සභාවේ සියලුම රැස්වීම්වල මූලාසනය ඔහු විසින් දරනු ලැබිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින්, රැස්වීමේ මූලාසනය දැරීම සඳහා එක් සාමාජිකයකු තෝරා ගනු ලැබිය යුතු ය.

(2) සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයින් පස් දෙනකු විය යුතුය. තව ද, සභාව විසින්, ගණපූරණය පිළිබඳ නියමයට යටත්ව, සභාවේ රැස්වීම් සම්බන්ධයෙන් වූ ක්‍රියා පටිපාටිය හා ඒ රැස්වීම්වල කටයුතු කිරීම විධිමත් කරනු ලැබිය හැකි ය.

(3) සභාවේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමව බෙදුණු අවස්ථාවක දී මූලාසනාරූඪ සාමාජිකයාට තීරක ඡන්දයක් හිමි විය යුතු ය.

**8**. (1) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ සභාපතිවරයාට ස්වකීය ධුරයේ කටයුතු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා සභාවේ වෙනත් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් නම් කළ යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා සභාපතිවරයාගේ පත්වීම අවසාන කළ හැකි ය.

(3) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබූ ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක සභාපති ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය. අමාත්‍යවරයා විසින් ඒ ඉල්ලා අස්වීම ලියවිල්ලකින් භාර ගත් විට එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, ඔහු සභාවේ සාමාජිකත්වය දරන කාලපරිච්ඡේදය විය යුතු ය.

**9.** යම් කරුණක් පිළිබඳව සභාව විසින් ගැනීමට තිබෙන යම් තීරණයක් විෂයෙහි කෙලින්ම හෝ අන්‍යාකාරයකින් යම් සම්බන්ධතාවක් ඇති සාමාජිකයකු විසින්, ඒ තීරණය ගනු ලබන්නේ සභාවේ යම් රැස්වීමක දී ද, ඒ රැස්වීමේ දී ඒ සම්බන්ධතාවේ ස්වභාවය එළිදරව් කරනු ලැබිය යුතු ය. ඒ එළිදරව් කිරීම සභාවේ රැස්වීම්වල කාර්ය සටහන්වල වාර්තා කරනු ලැබිය යුතු ය. තව ද ඒ කරුණ පිළිබඳව සභාව විසින් පවත්වනු ලබන යම් සාකච්ඡාවක දී හෝ තීරණයකට එළඹීමේ දී ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු අතර, ඒ සාකච්ඡාව පැවැත්වෙන අතරතුර හෝ ඒ තීරණයට එළඹෙන අතරතුර ඒ සාමාජිකයා ඒ රැස්වීමෙන් ඉවත්ව සිටිය යුතු ය.

**10.** සභාවේ සාමාජිකයින් අතර පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයකු පත්කිරීමෙහිලා යම් දෝෂයක් තිබීම පමණක් හේතුකොට ගෙන සභාවේ ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කටයුත්තක් නිර්බල නොවිය යුතු ය.

**11.** (1) සභාවේ මුද්‍රාව සභාව භාරයේ තිබිය යුතු ය.

(2) සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් සභාවේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) සභාවේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තැබීම සභාවේ සාමාජිකයන් ඉදිරිපිට දී මිස, නොකළ යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි අත්සන් කළ යුතු ය.

## II වන කොටස

## අරමුණු, බලතල හා කර්තව්‍ය

**12.** සභාවේ අරමුණු—

(අ) ක්‍රමවත් හා සාධාරණ පිළිවෙලකට සුරැකුම්පත් නිකුත් කිරීම හා වෙළෙඳාම කළ හැකි වෙළෙඳපොලක් ඇති කිරීම හා පවත්වාගෙන යාම ;

(ආ) ආයෝජකයන්ගේ මූල්‍ය සම්බන්ධතාව ආරක්ෂා කිරීම ;

(ඇ) ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු සිය ගිවිසුම් පිළිබඳ බැඳීම් ඉටු කිරීමට අසමත්වීමේ හේතුවෙන් පැන නගින මූල්‍ය පාඩුවලින් ආයෝජකයන් ආරක්ෂා කිරීම පිණිස වන්දි අරමුදලක් ක්‍රියාත්මක කිරීම ; හා

(ඈ) සුරැකුම්පත් වෙළෙඳපොල විධිමත් කිරීම හා ඒ වෙළෙඳපොලෙහි වෘත්තීය ප්‍රමිති පවත්වාගෙන යනු ලබන බව සහතික කිරීම

විය යුතු ය.

**13.** ස්වකීය අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය සියල්ල හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය:—

(අ) සංස්ථාවකට ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් ලෙස ක්‍රියා කිරීම පිණිස බලපත්‍රයක් ප්‍රදනය කිරීම සහ එහි ව්‍යාපාර කටයුතු නිසි ලෙස කරගෙන යන බවට වග බලා ගැනීම ;

(ආ) යම් තැනැත්තකුට, අවස්ථාවෝචිත පරිදි, ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු ලෙස ක්‍රියා කිරීම පිණිස බලපත්‍රයක් ප්‍රදනය කිරීම සහ ඔහුගේ ව්‍යාපාර කටයුතු නිසි ලෙස කරගෙන යන බවට වග බලා ගැනීම ;

(ඇ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට කලින් කල විධාන නිකුත් කිරීම ;

(ඈ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු සිය ගිවිසුම් පිළිබඳ බැඳීම් ඉටු කිරීමට අසමත්වීමේ හේතුවෙන් මුදලින් පාඩු විඳින යම් ආයෝජකයකුට වන්දි ප්‍රදනය කිරීම ;

(ඉ) සුරැකුම්පත් වෙළෙඳපොල සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම ;

(ඊ) සභාවේ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයෙහි යෙදවීම ;

(උ) රීති සෑදීමට මේ පනතින් නියමිත කාරණා සම්බන්ධයෙන් රීති සකස් කිරීම ;

(ඌ) ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා යම් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම් හෝ යම් නියමිත සුරැකුම්පත් සම්බන්ධ වෙළඳාම් කිරීම් අත්හිටුවීම හෝ අවලංගු කිරීම ;

(එ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ ද බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කළ පොදු සමාගම්වල ද ව්‍යාපාර කටයුතු පරීක්ෂණයට භාජනය කිරීම ;

(ඒ) යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු විසින් හෝ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කළ පොදු සමාගමක් විසින් කරන ලද අයුතු ක්‍රියා පිළිබඳ තීරණ ප්‍රසිද්ධ කිරීම ;

(ඔ) සුරැකුම්පත් වෙළෙඳපොල සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඕ) කවර හෝ ආකාරයකින් යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම ;

(ක) සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හෝ මේ පනත යටතේ එහි බලතල ක්‍රියාත්මක කිරීමට ආනුෂංගික වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා කිරීම.

**14.** 13 වන වගන්තියේ නිශ්චිතව සඳහන් බලතලවලට අතිරේකව පහත සඳහන් දේ කිරීමේ බලය සභාවට තිබිය යුතුය :—

(අ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථාන, ව්‍යාපාර වස්තු වෙළෙන්දන් සහ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්, මේ පනත යටතේ සාදන ලද රීතිවලට සහ නියෝගවලට අනුකූලව තම කටයුතු කරගෙන යත්දැයි තීරණය කිරීම සඳහා ඒ විනිමය ස්ථානවල හා තැනැත්තන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව නිතිපතා සෝදිසි කිරීම පැවැත්වීම ; සහ

(ආ) වාර්ෂික ශේෂ පත්‍ර සහ ආදායම් ප්‍රකාශන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සහතික කරනු ලැබ සභාව නිශ්චය කරන ආකෘතියට අනුව සභාවට ඉදිරිපත් කරන ලෙස බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට සහ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට නියම කිරීම.

### iii වන කොටස

### ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට, ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකුට බලපත්‍ර ප්‍රදානය කිරීම

**15.** 30 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, නියමිත දිනයේ සිට හා ඉන්පසුව—

(අ) ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් පැවැත්වීමේ ව්‍යාපාරය කරගෙන යන හෝ කරගෙන යෑමට අදහස් කරන යම් සංස්ථාවක් විසින් ; හෝ

(ආ) ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ ව්‍යාපාරය කරගෙන යන හෝ කරගෙන යාමට අදහස් කරන යම් තැනැත්තකු විසින්,

අවස්ථාවෝචිත පරිදි, ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් හෝ බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබීමේ කාර්ය සඳහා නියමිත ආකෘතියේ වූ ඉල්ලීමක් නියමිත ගාස්තුවක් සමග සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

**16.** මෙහි උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා නොකරන සංස්ථාවකට ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

**17.** මෙහි උපලේඛනයේ II වන කොටසෙහි දක්වා ඇති නියමවලට හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා නොකරන සංස්ථාවකට, අවස්ථාවෝචිත පරිදි, ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් හෝ මේ පනත යටතේ බලපත්‍රයක් ප්‍රදානය කරනු නොලැබිය යුතුය.

**18.** මෙහි උපලේඛනයේ III වන කොටසේ දක්වා ඇති නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා නොකරන කිසිම පුද්ගලයකුට මේ පනත යටතේ බලපත්‍රයක් ප්‍රදානය නොකළ යුතු ය.

**19.** (1) 15 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ලැබුණු විට සභාව විසින් එකී ප්‍රකාශිත කරුණු සලකා බැලීමෙන් පසු සහ අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන්නේ නම්, පෞද්ගලිකව හෝ නියෝජිතයකු මගින් කරුණු කියා සිටීමේ අවස්ථාවක් ඉල්ලුම්කරුට සලසා දීමෙන් පසුව, ඉල්ලුම්කරුට යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, ඉල්ලුම්කරුට බලපත්‍රයක් ප්‍රදානය කෙරෙන හෝ නොකෙරෙන බව දැනුම් දිය යුතු ය.

(2) සභාව විසින්—

(අ) ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් ව්‍යාපාරය කරගෙන යාමට සංස්ථාවකට බලපත්‍රයක් නිකුත් කරන අවස්ථාවක ඒ බවට සහතිකයක් අවුරුදු පහක කාලයක් සඳහා නිකුත් කළ යුතු ය ; නැතහොත්

(ආ) ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාමට යම් පුද්ගලයකුට බලපත්‍රයක් නිකුත් කරන අවස්ථාවක, ඒ බවට සහතිකයක් අවුරුද්දක කාලයක් සඳහා නිකුත් කළ යුතු ය.

**20.** (1) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් ස්වකීය බලපත්‍රය අලුත් කරවා ගැනීම සඳහා ඉල්ලීමක්, එකී බලපත්‍රයේ කාලය ඉකුත්වීමට පෙර වූ මාස හය ඇතුළත සභාව වෙත ඉදිරිපත් කළ හැකිය.

(2) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ විසින් තම බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක්, නියමිත ආකෘතියෙහි නියමිත ගාස්තුව ද සමග, එම බලපත්‍රයේ වලංගු කාලය ඉකුත්වීමට පෙරාතුව වූ මාස තුන ඇතුළත සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(3) බලපත්‍රය අලුත් කිරීමක දී, අවස්ථාවෝචිත පරිදි, ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්ද විසින් හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරු විසින් කිසිම අවස්ථාවක මේ පනතේ යම් විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් රීති නැතහොත් නියෝග හෝ කඩකිරීමට වරදකරු වී නැති බවට සභාව සෑහීමට පත්විය යුතු ය.

**21.** (1) ව්‍යාපාර වස්තු වෙළෙන්දකුට හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුට ප්‍රදානය කර ඇති බලපත්‍රයක් පහත දැක්වෙන අවස්ථාවලදී සභාව විසින් අවලංගු කිරීම හෝ අත්හිටුවීම කළ යුතුය :—

(අ) ව්‍යාපාර වස්තු වෙළෙන්ද හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරු මේ පනතේ යම් විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් රීති හෝ නියෝග කඩ වන සේ ක්‍රියාකර ඇති බවට සභාව සෑහීමට පත් වූ අවස්ථාවක ; හෝ

(ආ) ව්‍යාපාර වස්තු වෙළෙන්ද හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරු මූල්‍ය වශයෙන් වැදගත් තත්ත්වයක් දැරීම අවසාන වී ඇති බවට සභාව සෑහීමට පත් වූ අවස්ථාවක ; හෝ

(ඇ) බලපත්‍රය ප්‍රදානය කරනු ලැබීමෙන් පසුව, ව්‍යාපාර වස්තු වෙළෙන්ද හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරු හෝ එම බලපත්‍රය ලැබීමට නුසුදුස්සකු වී ඇති බවට සභාව සෑහීමට පත්වූ අවස්ථාවක ; හෝ

(ඈ) ස්වකීය කටයුතු කළමනාකරණයේදී ව්‍යාපාර වස්තු වෙළෙන්ද හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරු අයුතු ක්‍රියා හෝ අවිධිමත් ක්‍රියා සම්බන්ධයෙන් වරදකරු වී ඇති බවට සභාව සෑහීමට පත්වූ අවස්ථාවක.

(2) ව්‍යාපාර වස්තු වෙළෙන්දකුට හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුට ප්‍රදානය කරන ලද බලපත්‍රයක්, මීට ඉහත වූ උපවගන්තිය අනුව අවලංගු කිරීමට පෙර, ඒ බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්දැයි හේතු දැක්වීමට අවස්ථාවෝචිත පරිදි ඒ ව්‍යාපාර වස්තු වෙළෙන්දට හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුට අවස්ථාවක් දිය යුතු ය.

(3) ව්‍යාපාර වස්තු වෙළෙන්දකුට හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුට දෙන ලද බලපත්‍රයක් අවලංගු කරන ලද අවස්ථාවක, ස්වකීය බලපත්‍රය නොපමාවම සභාවට ආපසු භාර දීම ඒ ව්‍යාපාර වස්තු වෙළෙන්දගේ හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුගේ කාර්යය විය යුතු ය.

**22.** (1) සභාව විසින්—

(අ) 19 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට ; හෝ

(ආ) 21 වන වගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට

ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ ප්‍රතික්ෂේප කිරීමට, අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට එරෙහිව, ඒ තැනැත්තාට තීරණය දන්වන ලද දිනයේ සිට තුන් මසක් ඇතුළත, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(2) සභාවේ තීරණය ගැන තමා සෑහීමට පත්වන ආකාරයට කරුණු පෙන්වන ලෙස අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සභාවට නියම කළ හැකි ය.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් වූ ඉල්ලුම්කරුවකු විසින්, ඒ ඉල්ලුම්කරුට තීරණය දැන්වූ දින සිට දින දහ හතරක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනා කළ හැකි ය. මේ වගන්තිය යටතේ වූ අභියාචනාවලට අදාළව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන ප්‍රතිශෝධන ඉල්ලීම්වලට අදාළව, එකී ව්‍යවස්ථාව යටතේ සාදන ලද රීති, මේ වගන්තියේ 3 වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම අභියාචනයකටම අදළ විය යුතුය.

(4) මේ වගන්තිය යටතේ වූ අභියාචනා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තුරු, ප්‍රතිශෝධන වශයෙන් අභියාචනාධිකරණයට කෙරෙන ඉල්ලීම්වලට අදළව එම ව්‍යවස්ථාව යටතේ සාදන ලද රීති මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වූ සෑම අභියාචනයක් සම්බන්ධයෙන් අදළ විය යුතුය.

(5) මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත කරන ලද අභියාචනයක් මත අභියාචනාධිකරණය විසින් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ තීරණය ස්ථිර කිරීම, ප්‍රතිශෝධනය කිරීම, මඳ වශයෙන් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි අතර යුක්තිය ඉටුවීම සඳහා අවශ්‍ය යම් ආඥාවක් කළ හැකි ය.

**23.** බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු නැතහොත් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු මියගිය හෝ ඉල්ලා අස්වූ හෝ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක සාමාජිකත්වයෙන් නෙරපනු ලැබූ අවස්ථාවක හෝ රෝගාතුරවීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා එකී ව්‍යාපාර වස්තු වෙළෙන්ද හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාම ඔහුට නොහැකි වූ අවස්ථාවක හෝ එකී ව්‍යාපාර වස්තු වෙළෙන්දට හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුට ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබූ අවස්ථාවක, සභාව විසින් එකී ව්‍යාපාර වස්තු වෙළෙන්දගේ හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුගේ ඉතිරිව පවතින ගිවිසුම්, අවස්ථාවෝචිත පරිදි වෙනත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු විසින් භාරගනු ලැබීම සඳහා කටයුතු සලස්වන ලෙස, ව්‍යාපාර වස්තු වෙළෙන්ද හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරු සාමාජිකයකු වී සිටි බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට විධාන කළ යුතු ය.

**24.** (1) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක රීති, සභාව විසින් අනුමත කර ඇති විට සභාවේ පූර්ව අනුමතය නොමැතිව ඒ රීති සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකළ යුතු ය.

(2) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක රීති සංශෝධනය කිරීමට එහි අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන අවස්ථාවක, පරිච්ඡින්න කිරීමෙන් හෝ වෙනස් කිරීමෙන් හෝ එකතු කිරීමෙන් හෝ ඒ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය ඒ රීතිවලට කිරීමට බලාපොරොත්තු වන සංශෝධන, ලිඛිත දැන්වීමක් මගින් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

(3) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් ඉදිරිපත් කරනු ලබන කරුණුවලට සවන් දීමෙන් පසුව සහ (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීම ලැබීමෙන් පසු දින විසි එකක් ඇතුළත, සභාව විසින් ඒ රීති සංශෝධනවලට අවසර දෙන්නේ ද නැතහොත් නොදෙන්නේ ද යන වග දැක්වෙන ලිඛිත දැන්වීමක් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට යැවිය යුතුය.

එම රීතිවලට අවසර නොදෙන අවස්ථාවක, සභාව විසින් එසේ අවසර නොදීමට හේතු දැක්විය යුතුය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ දැන්වීම ලැබුණු පසු ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් ඒ දැන්වීම ක්‍රියාත්මක කළ යුතු ය.

**25.** අවස්ථාවෝචිත පරිදි බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු විසින් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් 15 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා කළ ඉල්ලීමෙහි එවකටත් සපයා ඇති යම් විස්තර වෙනස් කිරීමට අදහස් කරන්නේ නම් හෝ එහි සඳහන් කර ඇති තත්ත්වයෙහි වෙනසක් ඇති කරන්නේ නම් හෝ ඇති කිරීමට අදහස් කරන්නේ නම්, ඒ වෙනස් කිරීම හෝ වෙනස් ඇති කිරීමට පෙර සභාවට දන්වා සභාවේ පූර්ව එකඟත්වය ලබා ගැනීම, අවස්ථාවෝචිත පරිදි, ඒ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දාගේ හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුගේ කාර්යය විය යුතු ය.

**26.** මේ පනත යටතේ කෙරෙන ඉල්ලීමක් හෝ අභියාචනයක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ නොමඟ යවන ප්‍රකාශයක් ඕනෑකමින් ම කරන, හෝ යම් කාරණයක් හෝ දෙයක් සඳහන් නොකර ඇතිවිට ඉල්ලීම වැදගත් අංශයකින් නොමඟ යවන ඉල්ලීමක් වන්නේ ද ඒ කාරණය හෝ දෙය ප්‍රකාශ කිරීමෙන් ඕනෑකමින් ම වැලකී සිටින හෝ පැහැර හරින තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් දස ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතුය.

**27.** කිසිම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු විසින් යම් ගනුදෙනුකරුවකුගේ ගිණුමට දරන යම් සුරැකුම්පත්, එම ගනුදෙනු-කරුගේ ලිඛිත කැමැත්ත නොමැතිව ණයට දීම හෝ ණයට දීමට පිළියෙල කිරීම හෝ ණයට යම් ගනුදෙනුකරුවකු වෙනුවෙන් දරන යම් සුරැකුම්පත්, එම ගනුදෙනුකරුගේ ලිඛිත කැමැත්ත නොමැතිව ඇප වශයෙන් යොදා ගෙන ණය ගැනීම හෝ ණය ගැනීමට පිළියෙල කිරීම නොකළ යුතු ය.

**28.** බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තු ගත කරන ලද පොදු සමාගමක කොටස් දරන කිසිම තැනැත්තකු, ඒ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් යොදා ගනු ලබන වෙළෙඳ කාර්ය පටිපාටියට අනුකූලව මිස, ඒ කොටස් නොවිකිණිය යුතු ය.

**29.** කිසිම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු, තමා සාමාජිකයකු වන ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයෙන් බාහිරව, ලැයිස්තුගත කළ සුරැකුම් පත් වෙළෙඳාම නොකළ යුතු ය.

**30.** (1) නියමිත දිනයේ සිට සහ ඉන්පසු, කිසිම සංස්ථාවක් හෝ පුද්ගලයකු විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාට හෝ සංස්ථාවට මේ පනතේ විධිවිධාන යටතේ සභාව විසින් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් හෝ බලපත්‍රයක් නිකුත් කර ඇත්නම් මිස, අවස්ථාවෝචිත පරිදි, ‘‘ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය ’’, ‘‘ ව්‍යාපාර වස්තු වෙළෙන්ද ’’ හෝ ‘‘ ව්‍යාපාර වස්තු තැරැව්කරු ’’ යන වචන භාවිතා නොකළ යුතු ය.

(2) නියමිත දිනයේ සිට සහ ඉන්පසු, කිසිම සංස්ථාවක් හෝ පුද්ගලයකු විසින්, ඒ සංස්ථාවට හෝ පුද්ගලයාට, අවස්ථාවෝචිත පරිදි ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාමට මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ බලය දී ඇත්නම් මිස, එසේ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක්, ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාම නොකළ යුතු ය :

එසේ වුව ද නියමිත දිනයට පෙරාතුව ම, අවස්ථාවෝචිත පරිදි ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් හෝ ව්‍යාපාර වස්තු වෙළන්දකු හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යමින් සිටි යම් සංස්ථාවක් හෝ පුද්ගලයකු, මේ පනත යටතේ බලපත්‍රයක් ලබා නොගෙන—

(අ) නියමිත දිනයේ සිට මාස තුනක කාල පරිච්ඡේදයක් ද ;

(ආ) එම කාල පරිච්ඡේදය ඉකුත්වීමට පෙර මේ පනත යටතේ වූ බලපත්‍රයක් සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළහොත්, බලපත්‍රය ප්‍රදානය කරන තුරු හෝ බලපත්‍රයක් ප්‍රදානය කිරීම අවසාන වශයෙන් ප්‍රතික්ෂේප කරන තුරු හෝ ඉල්ලුම්පත්‍රය ඉල්ලා අස්කර ගන්නා තුරු

එම ව්‍යාපාරය කරගෙන යාමට හිමිකම් ලැබිය යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් සංස්ථාවක් හෝ පුද්ගලයෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් දස ලක්ෂයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

**31.** මේ පනතේ විධිවිධාන යටතේ අවස්ථාවෝචිත පරිදි ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් බලපත්‍රලත් කිසිම සංස්ථාවක් හෝ පුද්ගලයෙක් හෝ එම බලපත්‍ර ලාභියාගේ යම් පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් හෝ එම බලපත්‍රලාභියාගේ යම් අධ්‍යක්ෂවරයකු හෝ—

(අ) එම සංස්ථාව හෝ පුද්ගලයා, ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් බලපත්‍ර ලබා සිටින අවස්ථාවක, ඊට හෝ ඔහුට ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් බලපත්‍රයක් ප්‍රදානය නොකළ යුතු ය ;

(ආ) එම සංස්ථාව හෝ පුද්ගලයා, ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් බලපත්‍ර ලබා ඇති අවස්ථාවක, ඊට හෝ ඔහුට ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් බලපත්‍රයක් ප්‍රදානය නොකළ යුතු ය.

## IV වන කොටස

### අභ්‍යන්තරික තැනැත්තන් විසින් ගනුදෙනු කිරීම

**32.** (1) සමාගමක් සමග දැනුවත්ව සම්බන්ධයක් ඇත්තා වූ හෝ නියමිත දිනයට ඉහතින් ම වූ මාස හය ඇතුළත යම් අවස්ථාවක සමාගමක් සමග දැනුවත්ව සම්බන්ධයක් තිබුණා වූ පුද්ගලයකු විසින් (8) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව—

(අ) සමාගම සමග වූ සම්බන්ධය ප්‍රකාර ඔහු දරන්නා වූ ;

(ආ) එවැනි සම්බන්ධයක් දරන්නා වූ ද ඒ සම්බන්ධයට තුඩු දුන් තත්ත්වයක් දරන්නා වූ ද තැනැත්තකු විසින් තම තත්ත්වයට අනුයුක්ත කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීම සඳහා හැර, අනාවරණය නොකළ යුතු යයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි වූ ; සහ

(ඇ) එම සුරැකුම්පත් සම්බන්ධයෙන් පළ නොකළ මිළ පිළිබඳ සංවේදී තොරතුරු ලෙස ඔහු දන්නා වූ

තොරතුරු ඔහුට ඇත්නම් ඔහු ඒ සමාගමේ ලැයිස්තුගත සුරැකුම්පත් වෙළඳාම් නොකළ යුතු ය.

(2) (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සමාගමක් සමග දැනුවත්ව සම්බන්ධයක් ඇත්තා වූ පුද්ගලයකු විසින් හෝ නියමිත දිනයට ඉහතින් ම වූ මාස හය ඇතුළත යම් අවස්ථාවක සමාගමක් සමග දැනුවත්ව සම්බන්ධයක් තිබුණා වූ පුද්ගලයකු විසින් හෝ වෙනත් සමාගමක ලැයිස්තුගත සුරැකුම්පත් වෙළඳාම් කිරීම—

(අ) පළමු සඳහන් සමාගම සමහ වූ සම්බන්ධය ප්‍රකාර ඔහු දරන්නා වූ ;

(ආ) එවැනි සම්බන්ධයක් දරන්නා වූ ද ඒ සම්බන්ධයට තුඩුදුන් තත්ත්වයක් දරන්නා වූ ද තැනැත්තකු විසින් තම තත්ත්වයට අනුයුක්ත කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීම සඳහා හැර, අනාවරණය නොකළ යුතු යයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි වූ ;

(ඇ) ඒ වෙනත් සමාගමේ සුරැකුම්පත් සම්බන්ධයෙන් පළ නො කළ මිළ පිළිබඳ සංවේදී තොරතුරු යැයි ඔහු දරන්නා වූ ; සහ

(ඇ) පළමු සඳහන් සමාගම සහ ඒ වෙනත් සමාගම යන දෙකම ඇතුළත් වන්නා වූ හෝ ඒවායින් එකක් සහ අනෙක් සමාගමේ සුරැකුම් පත් ඇතුළත් වන්නා වූ හෝ තථ්‍ය නැතහොත් අදහස් කරන ලද යම් ගනුදෙනුවකට අදාළ වූ හෝ එවැනි යම් ගනුදෙනුවක් තවදුරටත් අදහස් නො කෙරෙන බවට වූ

තොරතුරු ඔහුට ඇත්නම් නොකළ යුතු ය.

(3) (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව—

(අ) යම් පුද්ගලයකු විසින් යම් විශේෂිත සමාගමක් සමග සම්බන්ධයක් ඇති වෙනත් පුද්ගලයකුගෙන් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් දැනුවත්ව ම ලබා ගන්නා ලද තොරතුරක් ඇත්තා වූ හෝ තොරතුරු ලබා ගැනීමේ දිනයට ඉහතින් ම වූ මාස හය ඇතුළත යම් අවස්ථාවක දී එසේ සම්බන්ධයන් ඇතිව සිටි වෙනත් පුද්ගලයකුගෙන්

කෙළින් ම හෝ අන්‍යාකාරයෙන් දැනුවත්ව ම ලබා ගන්නා ලද තොරතුරක් ඇත්තා වූ සහ ඒ වෙනත් පුද්ගලයකු එසේ සම්බන්ධයක් ඇති ව සිටීම නිසා ඒ තොරතුර දරන ලද බව කලින් සඳහන් කළ පුද්ගලයා දන්නා වූ හෝ එසේ විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඇත්තා වූ අවස්ථාවක ; සහ

(ආ) පසුව සඳහන් කළ පුද්ගලයාගේ සම්බන්ධතාව සහ තත්ත්වය අනුව ඒ තත්ත්වයට අනුයුක්ත කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීම සඳහා හැර ඔහු විසින් ඒ තොරතුරු අනාවරණය නොකෙරෙතැයි අපේක්ෂා කිරීම යුක්ති සහගත බව කලින් සඳහන් පුද්ගලයා දරන්නා වූ හෝ එසේ විශ්වාස කිරීමට ඔහුට යුක්ති සහගත හේතු ඇත්තා වූ අවස්ථාවක,

කලින් සඳහන් කළ පුද්ගලයා—

(i) ඒ සමාගමේ සුරැකුම්පත් සම්බන්ධයෙන් ඒ තොරතුරු පළ නොකළ, මිළ පිළිබඳ සංවේදී තොරතුරක් බව ඔහු දන්නේ නම්, ඒ සුරැකුම්පත් තමා විසින් ම, වෙළඳාම් නොකළ යුතු ය ; තවද

(ii) ඒ තොරතුරු වෙනත් සමාගමක ලැයිස්තුගත සුරැකුම්පත් සම්බන්ධයෙන් පළ නොකළ, මිළ පිළිබඳ සංවේදී තොරතුරක් බව ඔහු දන්නේ නම්, සහ පළමු සඳහන් සමාගම සහ වෙනත් සමාගම ඇතුළත් වන්නා වූ හෝ ඒවායින් එක් සමාගමක් සහ අනෙක් සමාගමේ සුරැකුම්පත් ඇතුළත් වන්නා වූ තථ්‍ය වූ නැතහොත් අදහස් කරන ලද්දා වූ යම් ගනුදෙනුවකට හෝ එවැනි යම් ගනුදෙනුවක් කිරීමට තවදුරටත් අදහස් නොකෙරෙන බවට වූ කාරණයට සම්බන්ධ බව ඔහු දන්නේ නම්, ඒ වෙනත් සමාගමේ සුරැකුම්පත් තමා විසින් ම වෙළඳාම් නොකළ යුතු ය.

(4) (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව යම් විශේෂිත තත්ත්වයකින් සමාගමක් සඳහා අත්කර ගැනීමේ අර්පණයක් කිරීමට වෙනත් තැනැත්තකු සමග හෝ වෙනත් තැනැත්තකු නොමැතිව හෝ පුද්ගලයකු විසින් අදහස් කරනු ලබන හෝ අදහස් කරනු ලැබ ඇති අවස්ථාවක, අර්පණය අදහස් කරනු ලබන බව හෝ තවදුරටත් අදහස් නොකෙරෙන බව එම සමාගමේ ලැයිස්තුගත සුරැකුම්පත්වලට අදාළ පළ නොකළ, මිළ පිළිබඳ සංවේදී තොරතුරක් යයි ඒ පුද්ගලයා දන්නේ නම් ඔහු වෙනත් තත්ත්වයකින්, ඒ සුරැකුම්පත් වෙළඳාම නොකළ යුතුය.

(5) (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, යම් පුද්ගලයකු විසින් (4) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන්නා වූ පුද්ගලයකුගෙන් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ (4) වන උපවගන්තියෙහි සඳහන් අර්පණය අදහස් කෙරෙන බව හෝ තවදුරටත් අදහස් නොකෙරෙන බවට තොරතුරක් දැන දැනම ලබා ගෙන ඇති අවස්ථාවක, ඒ තොරතුර එම සමාගමේ ලැයිස්තුගත සුරැකුම්පත්වලට අදාළ නොකළ, මිළ පිළිබඳ සංවේදී තොරතුරක් බව තමා දන්නේ නම් පළමු සඳහන් පුද්ගලයා තමා විසින් ම ඒ සුරැකුම්පත් වෙළඳාම් කිරීම නොකළ යුතු ය.

(6) (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව ලැයිස්තුගත සුරැකුම්පත් වෙළෙඳාම් කිරීමෙන් මේ වගන්තියේ යම් විධිවිධානයකින් තත්කාලයෙහි තහනම් කරනු ලබන පුද්ගලයකු වෙනත් යම් තැනැත්තකු ඒවා වෙළඳාම් කරනු ඇතැයි දැන දැනම හෝ විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඇතිව එම සුරැකුම්පත් වෙළඳාම් කිරීමට ඒ වෙනත් තැනැත්තාට උපදෙස් දීම හෝ සැලැස්වීම හෝ නොකළ යුතු ය.

(7) (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, යම් තොරතුරක් තමා වෙත තිබීමේ හේතුවෙන් ලැයිස්තු ගත සුරැකුම්පත් වෙළඳාම් කිරීමෙන් ඉහත කී පරිදි තත් කාලයෙහි තහනම් කරනු ලබන පුද්ගලයකු විසින් ඒ තොරතුරු වෙනත් යම් තැනැත්තකුට දැනුම් දීම, ඒ තැනැත්තා විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් ඒ ලැයිස්තුගත සුරැකුම්පත් වෙළඳාම් කිරීමේ හෝ වෙළඳාම් කිරීමට වෙනත් යම් තැනැත්තකුට උපදෙස් දීමේ හෝ සැලැස්වීමේ කාර්ය සඳහා ඒ තොරතුර පාවිච්චි කරනු ඇතැයි ඔහු දන්නේ නම් හෝ විශ්වාස කිරීමට යුක්ති සහගත හේතුවක් ඇත්තේ නම්, නොකළ යුතු ය.

(8) යම් තොරතුරක් යම් පුද්ගලයකු වෙත තිබීමේ හේතුවෙන්—

(අ) ඒ තොරතුර පාවිච්චි කිරීමෙන් තමා සඳහා හෝ වෙනත් තැනැත්තකු සඳහා හෝ ලාභයක් ඇති කර ගැනීමේ හෝ පාඩුවක් වැළැක්වීමේ අරමුණ ඇතිව හැර, අන්‍යාකාරයකින් යම් විශේෂිත දෙයක් කිරීම ;

(ආ) ඇවරකරුවකු, භාර ගැනුම්කරුවකු හෝ බුන්වත් භාවයේ දී භාරකරුවකු වශයෙන් තම කර්තව්‍ය සද්භාවයෙන් ක්‍රියාත්මක කරන අතරතුර ගනුදෙනුවකට ඇතුළත් වීම ; හෝ

(ඇ) (i) ඔහු නිරත ව හෝ සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටි ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ ව්‍යාපාරයේ කටයුතු අතරතුර දී ඔහු විසින් තොරතුර ලබා ගන්නා ලද්දේ නම් ; සහ

(ii) ඒ ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතු අතරතුර ඔහු ලබාගනිතැයි යුක්ති සහගත ලෙස බලාපොරොත්තු විය හැකි විස්තරයකට ඒ තොරතුර අයත් වූයේ නම් සහ

ඒ ව්‍යාපාරය අතරතුර ඒ දෙය ඔහු විසින් සද්භාවයෙන් කරනු ලබන්නේ නම් යම් විශේෂිත දෙයක් කිරීම

මේ වගන්තියේ විධිවිධාන මගින් තහනම් නොකළ යුතුය.

(9) (අ) යම් විශේෂිත ගනුදෙනුවකට අදාළ තොරතුරක් තමාවෙත තිබීම නිසාම පුද්ගලයකු විසින් ලැයිස්තුගත සුරැකුම්පත් වෙළඳාම් කිරීම (2) වන උපවගන්තියේ (3) වන උපවගන්තියේ (ii) ඡේදයේ, (4) වන උප වගන්තියේ හෝ (5) වන උපවගන්තියේ විධිවිධාන වලින් ; හෝ

(ආ) ඉහත (අ) ඡේදයෙහි සඳහන් විධිවිධාන කිසිවකින් තමාට ගනුදෙනු කිරීම තහනම් කරනු ලැබ ඇති ලැයිස්තුගත සුරැකුම්පත් සම්බන්ධයෙන් වෙනත් දෙයක් කිරීම (6) වන උපවගන්තියේ හෝ (7) වන උපවගන්තියේ විධිවිධානවලින්

තහනම් කිරීම, ගනුදෙනුව සම්පූර්ණ කිරීම හෝ ක්‍රියාත්මක කිරීම පිණිස ඔහු විසින් ඒ දෙය කරනු ලබන්නේ නම් නොකළ යුතු ය.

(10) ලැයිස්තුගත සුරැකුම්පත් වෙළඳාම් කිරීමට වෙනත් යම් තැනැත්තකුට උපදෙස් දීමෙන් හෝ සැලැස්වීමෙන් (8) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන හැර, මේ වගන්තියේ විධිවිධානවලින් තහනම් කරනු ලැබ ඇති භාරකරුවකු හෝ නීත්‍යානුකූල නියෝජිතයකු විසින් භාරකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා සංස්ථාවක් නම් ඒ භාරකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා වෙනුවෙන් ක්‍රියා කරන පුද්ගලයකු විසින්, එම ලැයිස්තුගත සුරැකුම්පත් වෙළඳාම් කරන විට හෝ වෙළඳාම් කිරීමට වෙනත් යම් තැනැත්තකුට උපදෙස් දෙන්නා වූ හෝ සලස්වන්නා වූ අවස්ථාවක ඔහු ක්‍රියා කළේ—

(අ) එවැනි උපදේශයක් ලබා ගැනීමට උචිත තැනැත්තකු යයි ඔහුට පෙනී ගිය ; සහ

(ආ) එම සුරැකුම්පත් වෙළඳාම් කිරීම මේ වගන්තියෙන් තහනම් කරනු ලැබූ තැනැත්තකු ලෙස ඔහුට පෙනී නොගිය

තැනැත්තකුගේ උපදෙස් මත නම්, ඔහු ඒ ඡේදයෙහි සඳහන් පරිදි ක්‍රියා කළ බව පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

**33.** (1) (අ) තම තත්ත්වය ප්‍රකාර රජයේ සේවකයකු විසින් හෝ රජයේ සේවකයකු වශයෙන් කලින් වූ තත්ත්වය ප්‍රකාර කලින් සිටි රජයේ සේවකයකු විසින් දරනු ලබන තොරතුරක් හෝ පුද්ගලයකු විසින් රජයේ සේවකයකු හෝ කලින් සිටි රජයේ සේවකයකු එවැනි යම් තත්ත්වයක් ප්‍රකාර දරන ලද බව දැනගෙන හෝ එලෙස විශ්වාස කිරීමට තමාට යුක්ති සහගත හේතු ඇතිව ඒ රජයේ සේවකයාගෙන් හෝ කලින් සිටි රජයේ සේවකයාගෙන් හෝ (කෙළින්ම හෝ අන්‍යාකාරයකින්) දැන ගැනීම ලබා ගන්නා ලද යම් තොරතුරක් ;

(ආ) රජයේ සේවකයකුගේ තත්ත්වයෙහි හෝ කලින් සිටි රජයේ සේවකයකුගේ කලින් වූ තත්ත්වයෙහි වූ පුද්ගලයකුගෙන් ඒ තත්ත්වයට අනුයුක්ත කර්තව්‍ය නිසිලෙස ඉටු කිරීම සඳහා හැර අනාවරණය නොකරතැයි අපේක්ෂා කිරීම යුක්ති සහගත වන යම් තොරතුරක් ; සහ

(ඇ) (මින් මතු මේ වගන්තියෙහි ''අදාළ සුරැකුම්පත්'' යනුවෙන් සඳහන් කරනු ලබන) යම් විශේෂිත සමාගමක ලැයිස්තුගත සුරැකුම්පත්වලට අදාළ පළ නොකළ, මිළ පිළිබඳ සංවේදී තොරතුරක් බව එය දරන පුද්ගලයා දන්නා වූ යම් තොරතුරක්

සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) මේ වගන්තිය අදාළ වන තොරතුර දරන රජයේ සේවකයකුට හෝ කලින් සිටි රජයේ සේවකයකුට සහ රජයේ සේවකයකු වශයෙන් ඇති හෝ කලින් තිබුණු තත්ත්වය ප්‍රකාර ඒ තොරතුර දරන ලද බව දැන සිටිමින් නැතහොත් තමාට ඒ බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඇතිව, රජයේ සේවකයකුගෙන් හෝ කලින් සිටි රජයේ සේවකයකුගෙන් (කෙළින්ම හෝ අන්‍යාකාරයකින්) එවැනි යම් තොරතුරක් දැන දැනම ලබාගත් යම් පුද්ගලයකුට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන අදාළ වන පුද්ගලයකු විසින්—

(අ) යම් අදාළ සුරැකුම්පත් වෙළඳාම් නොකළ යුතු ය ;

(ආ) වෙනත් යම් තැනැත්තකු විසින් අදාළ සුරැකුම්පත් වෙළඳාම් කරතැයි දැන දැනම හෝ එ බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඇතිව එවැනි යම් සුරැකුම්පත් වෙළඳාම් කරතැයි දැන දැනම හෝ ඒ බව විශ්වාස කිරීමට සැලැස්වීම නොකළ යුතු ය ; තවද

(ඇ) (2) වන උපවගන්තියෙහි සඳහන් පරිදි අවස්ථාවෝචිත පරිදි ඔහු විසින් දරන ලද හෝ ඔහු විසින් ලබා ගන්නා ලද තොරතුර වෙනත් යම් තැනැත්තකුට දැනුම් දීම, ඒ තොරතුර ඒ තැනැත්තා විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් ඒ අදාළ

සුරැකුම්පත් වෙළඳාම් කිරීමට වෙනත් යම් තැනැත්තකුට උපදෙස් දීමේ හෝ සැලැස්වීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන බව දන්නේ නම් හෝ ඒ බව විශ්වාස කිරීමට හේතු ඇත්නම් නොකළ යුතු ය.

(4) යම් පුද්ගලයකු යම් දෙයක් කරන්නේ යම් විශේෂිත ගනුදෙනුවක් සම්පූර්ණ කිරීම හෝ ක්‍රියාත්මක කිරීම පහසු කිරීමට නම්, එම ගනුදෙනුවට අදාළ තොරතුරක් ඔහු වෙත තිබීමේ හේතුව නිසාම පමණක්, මේ වගන්තියේ විධිවිධාන කිසිවකින් ඔහු විසින් එම දෙය කිරීම තහනම් නොකරනු ලැබිය යුතු ය.

**34.** (1) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා පුද්ගලයකු සමාගමක් හා සම්බන්ධ ලෙස සැලකෙන්නේ—

(අ) ඔහු ඒ සමාගමේ හෝ සම්බන්ධිත සමාගමක අධ්‍යක්ෂවරයකු නම් ; හෝ

(ආ) ඔහු ඒ සමාගමේ හෝ සම්බන්ධිත සමාගමක (අධ්‍යක්ෂවරයකු නොවන්නා වූ) නිලධරයකු හෝ සේවා නියුක්තයකු වශයෙන් තත්ත්වයක් හෝ තමා (හෝ තම සේවා යෝජකයා හෝ තමා අධ්‍යක්ෂවරයකු වශයෙන් සිටින සමාගමක්) සහ කලින් සඳහන් කරන ලද සමාගම හෝ සම්බන්ධිත සමාගමක් අතර වෘත්තීය හෝ ව්‍යාපාර සම්බන්ධතාවක් ඇතුළත් තත්ත්වයක් දරන්නා වූ ද මේ කවර තත්ත්වයක් අනුව හෝ පළමු සමාගම හෝ සම්බන්ධිත සමාගම යන දෙකින් කවර හෝ සමාගම පිළිබඳ ලැයිස්තුගත සුරැකුම්පත් සම්බන්ධයෙන් වූ ද තම කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීම සඳහා හැර, අනාවරණය නොකරතැයි ඔහුගේ තත්ත්වයේ වූ තැනැත්තකුගෙන් බලාපොරොත්තු වීම යුක්ති සහගත වන්නා වූ ද පළ නොකළ මිළ පිළිබඳ සංවේදී තොරතුරුවලට ප්‍රවේශවීමේ අවස්ථාවක් ඔහුට ලැබෙතැයි සාධාරණව බලාපොරොත්තු විය හැකි නම්

පමණක් ය.

(2) යම් සමාගමක යම් ලැයිස්තුගත සුරැකුම්පත් සම්බන්ධයෙන් ''පළ නොකළ මිළ පිළිබඳ සංවේදී තොරතුර'' ගැන මේ පනතේ මේ කොටසෙහි වූ කිසියම් සඳහනක්—

(අ) ඒ සමාගමට (කෙළින්ම හෝ අන්‍යාකාරයකින්) අදාළ වන හෝ ප්‍රවේදිතාවක් ඇත්තා වූ නිශ්චිත කාරණාවලට අදාළ එනම්, ඒ සමාගමට අදාළ වන හෝ ප්‍රවේදිතාවක් ඇති සාමාන්‍ය ස්වභාවයේ තොරතුරු නොවන ; සහ

(ආ) එම ලැයිස්තුගත සුරැකුම්පත් සම්බන්ධයෙන් ගනුදෙනු කිරීමට පුරුදු වූ හෝ ඉඩ ඇත්තා වූ තැනැත්තන්ට සාමාන්‍යයෙන් දැන ගැනීමට නො ලැබුණු එහෙත් ඔවුන්ට සාමාන්‍යයෙන් දැන ගැනීමට ලැබුණේ නම් එම සුරැකුම්පත්වල මිළ කෙරෙහි වැදගත් ආකාරයකින් බලපෑමට ඉඩ ඇත්තා වූ

තොරතුර ගැන වූ සඳහනක් වේ.

(3) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ පනතේ මේ කොටසෙහි—

''සමාගම'' යන්නෙන් මේ පනතේ අර්ථානුකූලව ලැයිස්තුගත කරන ලද යම් පොදු සමාගමක් අදහස් වේ ;

යම් සමාගමක් සම්බන්ධයෙන් වන විට ''සම්බන්ධිත සමාගම'' යන්නෙන් ඒ සමාගමේ පාලිත සමාගම හෝ පාලක සමාගම හෝ ඒ සමාගමේ පාලක සමාගමේ පාලිත සමාගමක් වන යම් සංස්ථාවක් අදහස් වේ ;

''සමාගමක් සඳහා අත්කර ගැනීමේ අර්පණය'' යන්නෙන් සමාගමේ කොටස් දරන සියල්ලන්ට (නැතහොත් අර්පණය කරන තැනැත්තා සහ ඔහුගේ නාමිකයන් නොවන සියලු කොටස් දරන්නන්ට) එම කොටස් හෝ ඒවායින් නිශ්චිත අනුපාතයක් අත්කර ගැනීමට හෝ ඒ කොටස්වලින් යම් විශේෂිත පංතියකට අයත් කොටස් දරන සියල්ලන්ට නැතහොත් අර්පණය කරන තැනැත්තා සහ ඔහුගේ නාමිකයන් හැර සියලු දරන්නන්ට, ඒ පන්තියේ කොටස් හෝ ඒවායින් යම් නිශ්චිත අනුපාතයක් හෝ අත්කර ගැනීමට කරන අර්පණයක් අදහස් වේ.

## V වන කොටස

## මුදල්

**35.** (1) සභාවට, සභාවේම අරමුදලක් තිබිය යුතු ය.

(2) ඒ අරමුදලට—

(අ) සභාවේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට සම්මත කරනු ලබන සියලු ප්‍රමාණයන් ;

(ආ) 15 වන වගන්තිය සහ 20 වන වගන්තිය යටතේ ගාස්තු වශයෙන් ගෙවනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඇ) ශ්‍රී ලංකාවෙහි හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර කවර වූ හෝ ප්‍රභවයකින් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදානයක් වශයෙන් සභාවට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්

ගෙවනු ලැබිය යුතු ය.

(3) සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය ඉටු කිරීමේ දී හා කාර්ය කිරීමේ දී සභාව විසින් දරනු ලබන වියදම් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලු මුදල් ප්‍රමාණයන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**36.** සභාවේ මුදල් වර්ෂය, එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයෙන් ආරම්භ වන මාස දොළහක කාල සීමාව විය යුතු ය.

**37.** (1) සභාව විසින් සභාවේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් හා වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට සලස්වනු ලැබිය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ ඇති විධිවිධාන සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**38.** (1) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු සිය ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට අසමත් වීම හේතුකොටගෙන මුදල් හානියකට භාජන වන යම් ආයෝජකයකුට වන්දි ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා වන්දි අරමුදල නම් වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) වන්දි අරමුදල, එහි කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන මුදල් ප්‍රමාණයන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) වන්දි අරමුදලට අයත් මුදල් සභාව විසින් තමන් තීරණය කරන ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකි ය.

**39.** (1) අමාත්‍යවරයා විසින් සභාවේ සාමාජිකයින් අතුරින් පත් කරනු ලැබිය යුතු සාමාජික-යින් තිදෙනෙකුගෙන් (මෙහි මින් මතු 'කමිටුව' යනුවෙන් හඳුන්වනු ලබන) සභාවේ වන්දි කමිටුව සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කමිටුව, 40 වන වගන්තිය යටතේ කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම හා ප්‍රදානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතු ය. තව ද එවැනි තක්සේරු කිරීමක් හෝ ප්‍රදානයක් සම්බන්ධයෙන් කමිටුවේ තීරණය සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

**40.** (1) යම් ආයෝජකයකු කෙරෙහි වූ ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවෙකු අසමත් වීම හේතු කොට ගෙන ඒ ආයෝජකයාට මුදල් හානියක් සිදු වී ඇති අවස්ථාවක, ඒ ආයෝජකයාට ඒ හානිය සිදු වූ දින සිට තුන් මාසයක් ඇතුළත වන්දි අරමුදලින් වන්දි හිමිකම් පෑමේ ඉල්ලීමක් ඒ ආයෝජකයා විසින් කමිටුව වෙත නියමිත ආකෘතිය අනුව කළ හැකි ය.

(2) වන්දි සඳහා හිමිකම් පෑමක් කර ඇති යම් ඉල්ලුම්කරුවකුගේ හිමිකම සනාථ කරනු පිණිස යම් ලේඛනයක් හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් කලින් කල එම ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය. ඒ නියමය අනුව කටයුතු කිරීමට ඉල්ලුම්කරු අසමත් වන අවස්ථාවක ඔහුගේ හිමිකම් පෑම කමිටුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) ඉල්ලුම්කරුගේ හිමිකම්පෑම සම්බන්ධයෙන් විභාගයක් පැවැත්වීම අවශ්‍ය යයි කමිටුව යම් අවස්ථාවක අදහස් කරන්නේ නම්, කමිටුව විසින් එසේ කරනු ලැබිය හැකි අතර, ලිඛිත දැන්වීමක් මගින්, එහි සඳහන් කරනු ලබන දිනයක, වේලාවක හා ස්ථානයක ඉල්ලුම්කරු පෙනී සිටිය යුතු යයි ඉල්ලුම්කරු වෙත දන්වනු ලැබිය යුතු ය. දැන්වීමෙහි සඳහන් දිනයේ දී ඒ විභාගය සඳහා පෙනී සිටීමට ඉල්ලුම්කරු අසමත් වන අවස්ථාවක කමිටුව විසින් ඔහුගේ හිමිකම් පෑම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

**41.** (1) ඉල්ලුම්කරුවකු විසින් තම හිමිකම් පෑම සනාථ කරනු පිණිස ඉදිරිපත් කරන ලද ලේඛන හා වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසුව හෝ විභාගයක් පවත්වනු ලැබූ යම් අවස්ථාවක ඒ විභාගය සමාප්ත වූ විට හෝ වන්දි සඳහා වූ ඒ හිමිකම් පෑම පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ කමිටුව විසින් කරනු ලැබිය හැකි ය.

(2) කමිටුව යම් හිමිකම්පෑමක් පිළිගන්නා අවස්ථාවක, ගෙවිය යුතු වන්දි ප්‍රමාණය පිළිබඳ තක්සේරුවක් කමිටුව විසින් කරනු ලැබිය යුතු අතර, ඊට අදාළ ව ප්‍රදානයක් කරනු ලැබිය යුතු ය. ඒ ප්‍රදානය පිළිබඳ දැන්වීම ඉල්ලුම්කරු වෙත ලිඛිතව දෙනු ලැබිය යුතුය.

(3) ගෙවිය යුතු වන්දි මුදල තක්සේරු කිරීම සම්බන්ධව සභාව විසින් රීති සෑදිය යුතු අතර කමිටුව විසින් (2) වන වගන්තිය යටතේ වන්දි තක්සේරු කිරීම ඒ රීතිවලට අනුකූලව කළ යුතු ය.

## vi වන කොටස

### සාමාන්‍ය කරුණු

**42.** (1) අමාත්‍යවරයා විසින්, සභාවේ අදහස් විමසා, සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු අතර, ඔහු එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමික ද ඇතුළුව සේවා කොන්දේසි අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා, සභාවේ සාමාන්‍ය මෙහෙයවීමට හා පාලනයට යටත් ව, සභාවේ වැඩ කටයුතු සහ ගණුදෙනු මෙහෙයවීම ද, සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම ද, සභාවේ සේවා නියුක්තයින් පිළිබඳ පරිපාලනය හා පාලනය ද භාරව සිටිය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ පනතින් තමා වෙත පිරිනමන ලද හෝ නියම කරන ලද හෝ භාර කරන ලද යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් යම් සේවා නියුක්තයකුට පැවරීම අවශ්‍ය යයි තමා සලකන කවර වූ හෝ අවස්ථාවක, සභාවේ අනුමතිය ඇතිව, එසේ කරනු ලැබිය හැකි අතර, ඒ සේවා නියුක්තයා විසින්, ඒ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය ඉටු කිරීම හෝ කාර්ය කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්-වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර ඒ ඉවත් කිරීම කිසිදු අධිකරණයක දී ප්‍රශ්න නොකරනු ලැබිය යුතු ය.

**43.** (1) සභාව විසින්, එහි කාර්ය ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි එය සලකන වෙනත් නිලධරයන් හා සේවකයින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට සභාව විසින් තීරණය කරනු ලබන ආකාරය හා අනුප්‍රමාණ අනුව වැටුප් ගෙවිය යුතු අතර, සභාව විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(3) සභාවේ ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට පත් කිරීම එම නිලධරයාගේ හා රාජ්‍ය පරිපාලනය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව සභාව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව හෝ කරනු ලැබිය හැකි ය.

(4) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට ගිවිසගෙන ඇති යම් තැනැත්තකු සභාව විසින් සේවයෙහි යොදවනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් සභාවට සේවය කරනු ලබන යම් කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට සේවය කරන ලද කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) සභාවේ ඉල්ලීම පරිදි, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු හෝ ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව සභාවේ කාර්ය මණ්ඩලයට සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන කාලයක් තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය ; නැතහොත් විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදළ නියම හා කොන්දේසි ඇතුළුව, සභාව හා පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ ඒ පළාත් පාලන ආයතනය විසින් එකඟ වන නියමයන් හා කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු හෝ (7) වන උප වගන්තිය යටතේ සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ඔහු ද යටත් විය යුතු ය.

**44.** (1) සභාවේ ඉල්ලීම පරිදි රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන කාලයක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් වලට අදාළ නියමයන් හා කොන්දේසි ද ඇතුළුව සභාව සහ එම සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් එකඟතාවයට පත්වන නියමයන් හා කොන්දේසි මත, සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක, කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුට බලපාන විනය පාලනයටම ඔහු ද යටත් විය යුතු ය.

**45.** (1) මේ පනතේ 13 වන වගන්තිය යටතේ සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය අතුරින් යමක් සභාව විසින් ක්‍රියාත්මක කළ හැකි වීම හෝ ඉටු කළ හැකි වීම සඳහා සභාව විසින් හෝ තත් කාර්යය සඳහා සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් සියලු වාර්තා හෝ තොරතුරු, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත සභාවට හෝ බලය දෙන ලද තැනැත්තාට සපයන ලෙස යම් තැනැත්තකුට නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් යම් වාර්තාවක් හෝ තොරතුරක් සැපයීමට නියම කරනු ලබන යම් තැනැත්තකු විසින්, ඒ වාර්තාව සැපයීම හෝ තොරතුරු හෙළිදරව් කිරීම යම් නීතියක් යටතේ වැළැක්වෙන අවස්ථාවක දී හැර, ඒ දැන්වීමෙහි නිශ්චිතව නියම කොට ඇති කාලසීමාව ඇතුළත ඒ නියමය අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) සභාව හෝ එහි යම් සාමාජිකයකු විසින් හෝ සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් හෝ (1) වන උපවගන්තිය යටතේ ලබා ගන්නා ලද යම් වාර්තාවක් හෝ තොරතුරක්, අධිකරණයක් විසින් නියම කරනු ලැබූ අවස්ථාවක හෝ සභාවේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්යය සඳහා මිස යම් තැනැත්තකුට හෙළිදරව් කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම හෝ නොකළ යුතු ය.

**46.** (1) යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක හෝ ඒ විනිමය ස්ථානයේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ වෘත්තීය පැවැත්ම හෝ කටයුතු පිළිබඳව ඒ විනිමය ස්ථානයේ ලැයිස්තුගත කර ඇති පොදු සමාගමක කොටස් හිමියන්ගේ පැමිණිලි විභාග කර තීරණය කිරීම සඳහා සභාවේ සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත කමිටුවක් සභාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) යම් කොටස් හිමියකු විසින් කරන ලද ලිඛිත පැමිණිල්ලක් ලැබුණු විට, ඒ පැමිණිල්ල සනාථ කිරීම සඳහා යම් ලියවිලි හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් කර ඇත්නම් ඒවා පරීක්ෂා කර බලා, ඒ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය හෝ ඒ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ විසින් මේ පනතේ යම් විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් රීතියක් නැතහොත් නියෝගයක් හෝ උල්ලංඝනය කර තිබේදැයි කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි ය. කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ඒ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට, බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දාට හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුට නොදී, එවැනි තීරණයක් නොකළ යුතුය.

(3) යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් හෝ ඒ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ විසින් මේ පනතේ යම් විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් රීතියක් නැතහොත් නියෝගයක් හෝ උල්ලංඝනය කර ඇතැයි කමිටුව විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දාට හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුට හෝ විරුද්ධව ගත යුතු ක්‍රියා මාර්ගයේ ස්වභාවය කමිටුව විසින් සභාවට නිර්දේශ කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කමිටුව විසින් කරන ලද නිර්දේශ ලැබුණු විට, සභාව විසින්, අවස්ථානුකූලයයි තමන් සලකන පරිදි, මේ පනතේ විධිවිධානවලට අනුකූලව පියවර ගත යුතු ය.

**47.** සභාවේ සියලුම සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

**48.** සභාව, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් කළ යුතු ය.

**49.** අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකෘතියකින්, සභාවේ වැඩ කටයුතු සම්බන්ධයෙන් වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින්, කලින් කල, සභාවට විධාන කරනු ලැබිය හැකි අතර, සභාව ඒ විධාන අනුව ක්‍රියා කළ යුතු ය.

**50.** (1) සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ සභාවේ නිලධරයන් හා සේවකයන් අතුරින් යම් නිලධරයකු නැතහොත් සේවකයකු විසින්, මේ පනත යටතේ හෝ සභාවේ විධානය යටතේ සද්භාවයෙන් යුතුව කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) සභාව විසින් හෝ සභාවට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියෙහි පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාව විසින් දරනු ලබන වියදම් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාවට ගෙවනු ලැබූ හෝ සභාව විසින් අයකර ගන්නා ලද නඩු ගාස්තු සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ සභාවේ විධානය යටතේ කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඒ තැනැත්තාට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම්, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේදී ඒ වියදම් ඔහු විසින් අයකර ගනු ලබන්නේ නම් මිස, ඒ ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් බවට අධිකරණය පිළිගතහොත් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**51.** (අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනතේ විධිවිධාන යටතේ කරන ලද නැතහොත් මේ පනත යටතේ සාදන යම් නියෝගයක විධිවිධාන යටතේ කරන ලද යම් නියමයක් උල්ලංඝනය කරන ;

(ආ) මේ පනතේ කාර්ය සඳහා, තමාගේ දැනුම අනුව අසත්‍ය හෝ සාවද්‍ය යම් තොරතුරක් හෝ එසේ අසත්‍ය හෝ සාවද්‍ය කරුණු ඇතුළත් යම් වාර්තාවක් ඉදිරිපත් කරන ; හෝ

(ඇ) සභාවේ සාමාජිකයකුට හෝ සභාවේ නිලධරයකුට හෝ සේවකයකුට මේ පනත යටතේ තම කාර්ය ඉටු කිරීමේදී ඕනෑකමින් බාධා කරන

යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු විය යුතුය.

(2) මේ පනත යටතේ වරදක් වූ ද ප්‍රකාශිතවම ඒ සඳහා දණ්ඩනයක් සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු ලැබ නොමැත්තා වූ ද වරදකට වරදකරු වන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට, අවුරුදු පහක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් ලක්ෂ සියයක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

**52.** (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත කරුණු සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි සඳහන් කරනු ලැබිය හැකි වෙනත් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එම ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ සෑම නියෝගයක් ම, ඒ යටතේ ඊට පෙර කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි, එසේ අනුමත නොකරනු ලැබූ දින සිට පරිච්ඡින්න වූ සේ සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න වූ සේ සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

**53.** 13 වන වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව සභාව විසින්, සුරැකුම්පත් සම්බන්ධයෙන් ක්‍රමවත් සහ සාධාරණ වෙළඳාමක් පැවැත්වීම සහතික කිරීම සඳහාත් ආයෝජකයන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම සඳහාත් කලින් කල අවශ්‍ය වන පරිදි පහත දැක්වෙන රීති සෑදිය හැකි ය:—

(අ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම ;

(ආ) වෙළෙන්දන් විසින් කොටස් ගනුදෙනු සම්බන්ධයෙන් හා සුරැකුම්පත් අත්කරගත් හෝ බැහැර කළ තැනැත්තන් විසින් සහ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථාන විසින් සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධයෙන් කරුණු හෙළි කිරීම ;

(ඇ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දන් විසින් සහ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් විසින් පොත්, වාර්තා, ගිණුම් සහ විගණන නිසි ලෙස පවත්වාගෙන යාම සහ එවැනි බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දන් සහ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් විසින් ස්වකීය කටයුතු පිළිබඳව සභාවට නිතිපතා වාර්තා කිරීම.

**54.** 1982 අංක 17 දරන සමාගම් පනතේ 220, 221, 222 සහ 223 වන වගන්ති ඉවත් කිරීමෙන් පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**55.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

''ආයෝජකයා'' යන්නෙන්, බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ මාර්ගයෙන් මිළ දී ගත් හෝ ගනුදෙනු කළ සුරැකුම්පත්වල ආයෝජනය කරන්නෙක් අදහස් වේ ;

''ලැයිස්තුගත පොදු සමාගම'' යන්නෙන් ස්වකීය සුරැකුම්පත් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තු ගත කර හෝ මිළ ලැයිස්තුගත කර ඇති යම් පොදු සමාගමක් අදහස් වේ ;

''ලැයිස්තුගත සුරැකුම්පත්'' යන්නෙන් යම් ලැයිස්තුගත පොදු සමාගමක සුරැකුම්පත් අදහස් වේ ;

''සුරැකුම්පත්'' යන්නෙන්, පොදු සමාගමක හෝ සංස්ථාවක ණය පත්‍ර, ව්‍යාපාර වස්තු සහ කොටස්, යම් ආණ්ඩුවක හෝ යම් සංස්ථාගත කළ හෝ නොකළ මණ්ඩලයක අරමුදල් හෝ බැඳුම්කර වෙනුවෙන් වූ යම් අයිතිවාසිකමක් හෝ මනාපයක් ඇතුළුව ඒ අරමුදල් හෝ බැඳුම්කර හෝ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක දී මිළට ගත් හෝ විකුණු වෙනත් යම් සහතිකයක් හෝ සම්බන්ධතාවක් අදහස් වේ ;

''ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය'' යන්නෙන් ව්‍යාපාරයට සම්බන්ධ සේවාවන් ඇතුළුව, විකිණීම, මිළදී ගැනීම හෝ හුවමාරුව සඳහා සුරැකුම් පත් නිතිපතා ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ පොලක්, විනිමය ස්ථානයක් හෝ වෙනත් ස්ථානයක් අදහස් වේ ;

''ව්‍යාපාර වස්තු තැරැව්කරු'' යන්නෙන්, කොමිස් මුදලක් සඳහා ආයෝජකයන් වෙනුවෙන් සුරැකුම්පත් මිළදී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් පුද්ගලයෙක් හෝ සංස්ථාවක් අදහස් වේ ;

''ව්‍යාපාර වස්තු වෙළෙන්ද'' යන්නෙන්, සුරැකුම්පත් මිලට ගැනීමේ හෝ සුරැකුම්පත් ගනුදෙනු කිරීමේ හෝ සුරැකුම්පත් තැරැව් කිරීමේ හෝ විකිණීමේ හෝ සුරැකුම්පත් ප්‍රතිරක්ෂණය කිරීමේ හෝ සිල්ලරට විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් පුද්ගලයකු හෝ සංස්ථාවක් අදහස් වේ.

# උපලේඛනය

(16 වන වගන්තිය)

## I වන කොටස

සංස්ථාවකට, ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා ඉටු වී තිබිය යුතු නියමයන් සහ කොන්දේසි පහත දක්වේ :—

(අ) ඉල්ලුම්කරු—

(i) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමිත වගකීම සහිත පොදු සමාගමක් බව ; හෝ

(ii) 1982 අංක 17 දරන සමාගම් පනතේ 21 වන වගන්තිය යටතේ සීමිත වගකීම් සහිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කරන ලද සංගමයක් බව ;

(ආ) (අ) ඡේදයේ සඳහන් ඉල්ලුම්කාර සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙන් සාමාජිකයන්ට යම් ලාභ බෙදීමට අවසර නොලැබෙන බව ;

(ඇ) ඉල්ලුම්කාර සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙන් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සාමාජිකත්වය වෙළෙන්දන්ට සහ තැරැව්කරුවන්ට පමණක් සීමා කරන බව ;

(ඈ) ඉල්ලුම්කාර සමාගමේ සාමාජිකයන් යටත් පිරිසෙයින් හය දෙනකුවත් ස්වාධීනව ද එකිනෙකා සමග තරඟකාරීව ද සුරැකුම්පත් පිළිබඳ තැරැව් ව්‍යාපාරය කරගෙන යන බව සහ යටත් පිරිසෙයින් සාමාජිකයන් සිව් දෙනකුටවත් පසුගිය අවුරුදු පහ ඇතුළත සුරැකුම්පත් තැරැව් කිරීම සම්බන්ධයෙන් පළපුරුද්දක් ඇති බව ;

(ඉ) ඉල්ලුම්කාර සමාගම යෙදී සිටින්නේ තනිකර ම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපාරයෙහි බව ;

(ඊ) ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධරයා ව්‍යාපාරික අවංක භාවයෙන් යුක්ත අය බව ;

(උ) ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, පුද්ගලිකවම ව්‍යාපාර වස්තු වෙළෙන්දන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් හෝ වන තැනැත්තන් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු නැතහොත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් බලපත්‍රලත් යම් සමාගමක නාමිතයන් වන තැනැත්තන් වන්නා වූ හා සාමාජිකයන්ගේ මහා මණ්ඩලය විසින් තෝරා පත්කර ගනු ලැබූ පස්දෙනකුගෙන් සමන්විත වන බව ;

(ඌ) ඉල්ලුම්කාර සමාගමේ පිහිටීම සහ එහි කටයුතු ශ්‍රී ලංකාව තුළ වඩාත් ක්‍රමවත් සුරැකුම්පත් වෙළඳ පොළක් ඇති කිරීමට හේතු වන බව ;

(එ) ඉල්ලුම්කාර සමාගමේ මුදල් තත්ත්වය සතුටුදායක බව ;

(ඒ) ඉල්ලුම්කාර සමාගමේ රීතිවලින් පහත සඳහන් දේ සඳහා හෝ ඒ සම්බන්ධයෙන් සතුටුදායක විධිවිධාන සලස්වා ඇති බව—

(i) සාමාජිකයන් බඳවා ගැනීම සඳහා ;

(ii) මනා චරිතයකින් සහ උසස් ව්‍යාපාරික අවංකභාවයකින් යුක්ත නොවන අය සාමාජිකත්වයෙන් බැහැරකිරීම සඳහා ;

(iii) ව්‍යාපාර කටයුතු කිරීමේදී යුක්ති සහගත සහ සාධාරණ පිළිවෙත් වලට අනුකූල නොවන ක්‍රියා කලාපය සම්බන්ධයෙන්, හෝ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ රීති හෝ මේ පනතේ විධිවිධාන කඩකිරීම හෝ ඒවාට අනුකූලව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් සාමාජිකයන් ඉවත් කිරීම, අත් හිටුවීම හෝ හික්මවීම සඳහා ;

(iv) බලයලත් නියෝජිතයන් සහ ලිපිකරුවන් පත් කිරීම සඳහා ;

(v) වෙළඳ පොලේ වෙළඳාම් කිරීම සඳහා සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම යටත් විය යුතු කොන්දේසි සම්බන්ධයෙන් ;

(vi) යම් නිශ්චිත සුරැකුම්පතක ලැයිස්තුගත කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම යටත් විය යුතු කොන්දේසි සම්බන්ධයෙන් ;

(vii) එහි සාමාජිකයන්ගේ සුරැකුම්පත් වෙළඳාම් පාලනය කෙරෙන කොන්දේසි සම්බන්ධයෙන් ;

(viii) තතුදත් ආයෝජන තීරණ ගැනීම සඳහා ආයෝජකයන්ට අවශ්‍ය සියලු වැදගත් තොරතුරු නිසිකලටත් නිවැරදි ලෙසත් හෙළි කිරීම සම්බන්ධයෙන් ;

(ix) සුරැකුම්පත්වල ආයෝජනය කරන්නන් සුරැකුම්පත් නිකුත් කිරීමේදී සහ සුරැකුම්පත් වෙළඳාම් කිරීමේදී වැරදි කරුණු දැන්වීම් වලින්, නොමග යවන තොරතුරුවලින්, වංචාවෙන්, රැවටීමෙන් හා වෙනත් අහිතකර පරිචයවලින් හා මහජනයාට තත්කාලයෙහි සපයා නොමැති වරප්‍රසාදවත් තොරතුරු ඇතැම් පුද්ගලයන්ගේ විනය අයුතුලෙස භාවිතා කිරීමෙන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ;

(x) ව්‍යාජ වෙළඳාම් කිරීම, වෙළෙඳපොළ මිළ ගණන් කෘත්‍රිම ලෙස උස් පහත් කිරීම් යනාදිය ඇතුළුව කවර හෝ ආකාරයකින් සුරැකුම්පත් වෙළඳ පොළ අයුතු ලෙස හැසිරවීම තහනම් කිරීම සම්බන්ධයෙන් ;

(xi) සුරැකුම්පත් වෙළඳාම් කිරීම සහ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ගේ මුදල් ගනුදෙනු විමර්ශනය කිරීම සඳහා සහ සාමාජිකයන් සම්බන්ධයෙන් හදිසි පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් ;

(xii) ආයෝජකයන්ගේ ආරක්ෂාව සඳහා හෝ ක්‍රමවත්ව සහ සාධාරණව වෙළෙඳාම පවත්වාගෙන යාම සඳහා යම් නියමිත සුරැකුම්පත් වෙළඳාම් කිරීම අත්හිටුවීම සඳහා ;

(xiii) ව්‍යාපාර වස්තු වෙළෙන්දන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් විසින් සුරැකුම්පත් වෙළඳාම් කිරීම සහ ගනුදෙනු සම්බන්ධයෙන් තොරතුරු තබාගත යුතු ආකාරය සම්බන්ධයෙන් ; සහ

(xiv) සුරැකුම්පත් තැරැව්කරුවන්ගේ හෝ වෙළෙන්දන්ගේ අනිකුත් ව්‍යාපාරවලින් ගනුදෙනුකරුවන්ගේ අරමුදල් වෙන්ව තබා ගන්නා බවට වග බලා ගැනීම සඳහා.

## II වන කොටස

(17 වන වගන්තිය)

ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකුට හෝ සංස්ථාවකට, බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා පිළිපැදිය යුතු නියමයන් සහ කොන්දේසි :—

(අ) ඉල්ලුම්කාර සමාගම මේ පනත යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක සාමාජිකයකු බව ;

(ආ) ඉල්ලුම්කරු, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් බව ;

(ඇ) ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂවරුන්—

(i) වස්තු භංගත්වයට පත්වූවන් ලෙස කිසි දිනක ප්‍රකාශයට පත් කර නැති බව ;

(ii) ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් හෝ බලපත්‍රයක් දීම කෙදිනක හෝ ප්‍රතික්ෂේප කරනු ලැබූ තැනැත්තන් නොවන බව නැතහොත් එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ සමාගමක අධ්‍යක්ෂවරුන්ව නොසිටි බව ; හෝ

(iii) ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් හෝ වූ තම බලපත්‍රය නිසි බලධරයා විසින් ඉවත් කිරීමට භාජනය වූ තැනැත්තන් නොවන බව නැතහොත් එසේ වූ සමාගමක අධ්‍යක්ෂවරුන්ව කෙදිනකවත් නොසිටි බව ;

(ඈ) ඉල්ලුම්කාර සමාගමේ යටත් පිරිසෙයින් එක් අධ්‍යක්ෂවරයකු සහ එම සමාගමේ ප්‍රධාන සේවා නියුක්තයා විය යුතු එක් සේවා නියුක්තයකු ව්‍යාපාර වස්තු විනිමය කටයුතු පිළිබඳව ප්‍රමාණවත් පුහුණුවක් ලැබූවන් ලෙස, මේ පනත යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් සහතික කරනු ලැබූ බව ; සහ

(ඉ) ඉල්ලුම්කාර සමාගම විසින් කරගෙන යාමට ඉඩ ඇති ගනුදෙනුවල වටිනාකම සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදලක ඇපය හෝ ඒ හා සමාන ප්‍රමාණයක බැංකු ඇපකර, ඉල්ලුම්කාර සමාගම විසින්, මේ පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වෙත තබා ඇති බව.

## III වන කොටස

(18 වන වගන්තිය)

පුද්ගලයෙකුට, ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා පිළිපැදිය යුතු නියමයන් හා කොන්දේසි :—

(අ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු බව ;

(ආ) ඉල්ලුම්කරු සුදුසු හා නිසි තැනැත්තකු බව සහ මනා මුදල් තත්ත්වයක සිටින බව ;

(ඇ) ඉල්ලුම්කරු මේ පනත යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක සාමාජිකයකු වන බව සහ ව්‍යාපාර වස්තු විනිමය කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් පුහුණුවක් ලැබූ බවට ඒ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් සහතික කරනු ලැබූවකු බව ;

(ඈ) ඉල්ලුම්කරු, එම ඉල්ලුම්කරු විසින් කර ගෙන යා හැකි ගනුදෙනුවල වටිනාකම සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදලක ඇපයක් හෝ ඒ හා සමාන ප්‍රමාණයක බැංකු ඇපකරයක්, මේ පනත යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වෙත තබා ඇති බව ; සහ

(ඉ) ඉල්ලුම්කරු මේ පනත යටතේ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක සාමාජිකත්වයෙන් පහ කරනු ලැබූ හෝ එම සාමාජිකත්වය ලැබීම තහනම් කරනු ලැබූ තැනැත්තකු නොවන බව.

# 1987 අංක 51 දරණ විසර්ජන පනත

**[සහතිකය සටහන් කළේ 1987 දෙසැම්බර් මස 30 වන දින]**

**1988 මුදල් වර්ෂයේ වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍යවන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යතෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ ඒවාට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැළසීමත් පිණිස වූ පනතකි.**

**1.** මේ පනත 1987 අංක 51 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි ''1988 මුදල් වර්ෂය'' යනුවෙන් සඳහන් කරනු ලබන, 1988 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භව 1988 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරු කර ඇති රුපියල් හයදහස් තුන්සිය පනස්හත්කෝටි තිස් හයලක්ෂ තිස් හතරදහසක් වූ ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් ; සහ

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් තුන්දහස් හත්සිය දොළොස් කෝටියක් නොඉක්මවන සේ, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ලබාගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින්

පියවිය යුතු ය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් හයදහස් තුන්සිය පනස්හත් කෝටි තිස්හය ලක්ෂ තිස් හතර දහසක් වූ මුදල මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනු-වෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බලපැවැත්විය යුතු ය.

**3.** (1) 1988 මුදල් වර්ෂය තුළ දී, මේ පනතෙහි දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුවට ලැබෙන ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්තය එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. එවැනි කටයුත්තකින් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම්, එය 1988 මුදල් වර්ෂය අවසන්වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිගමනය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන ගෙවීම්, එනම් :—

(අ) කිසියම් කටයුත්තක ආදායමට අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම් ; සහ

(ආ) කිසියම් කටයුත්තක නිශ්චල හා චංචල දේපළ වෙනුවෙන් ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන

ඒ එක් එක් කටයුත්තක ආදායමින් අඩු කළ යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1988 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම්, ඒ මුදල් වර්ෂය තුළදී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ II වන තීරයෙහි අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

(4) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 1988 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. තවද, ඒ මුදල් වර්ෂයේ අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම්, එම උප ලේඛනයේ V වන තීරයෙහි අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

**4.** 1988 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක, මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි හෝ වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකි ය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උප ලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

**5.** (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම් වලට එම උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර වෙන් කරනු ලැබුවා වූ ද එහෙත් වියදම් නොකරන ලද්ද වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද යම් මුදලක්, එම වැඩ සටහනේම මූලධන වියදමේ වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේ ම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට, භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතු ය.

**6.** (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩුවිය හැකි බවට ; හෝ

(2) යම්කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට

අමාත්‍යවරයා සෑහීමකට පත් වන අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදහරින ලද මුදල් සම්පූර්ණ-යෙන් හෝ ඉන් කොටසක් හෝ ඉවත් කර ගැනීම, අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකි ය.

**7.** අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ අනුමතය ඇතිව—

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි සහ V වන තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක් ;

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන තීරයෙහි දැක්වෙන අවම සීමා,

නියමයක් මගින්, 1989 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්-තුව විසින් අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතු ය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද ඒ දිනයට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැළකිය යුතු ය.

**8.** පාර්ලිමේන්තුව විසින්, යෝජනා සම්මතයක් මගින්, මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ—

(අ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් ;

(ආ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව

එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.